# 2012

## වාර්ෂික වාර්තාව



ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
இலங்கைத் தேசியத் திரைப்படக் கூட்டுத்தாபனம்
National Film Corporation of Sri Lanka

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# වාර්ෂික වාර්තාව
# 2012

# පටුන


| | පිටුව |
| --- | --- |
| පිළිගැන්වීම | 01 |
| පාලන වාර්තාව | 02 - 21 |
| ශේෂ පත්‍රයල ලාභාලාභ ගිණුම් හා ආශ්‍රිත සටහන් | 22 - 40 |
| විගණකාධිපති වාර්තාව | 41 - 53 |
| විගණකාධිපති විසින් ගිණුම් පිළිබඳ දක්වන ලද අදහස් වලට සංස්ථා සභාපති සැපයූ පිළිතුරු | 54 - 65 |

“ශ්‍රීලාංකේය සිනමාවක් ගොඩනැගීම සඳහා රාජ්‍ය අංශයේ දායකත්වය”

## - පිළිගැන්වීම -

දිනය :- 2013.09.18 දින. මගේ අංකය : එන්එෆ්සී/103/05/02/91

ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍ය,
ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය,
අංක 163,
කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - වාර්ෂික වාර්තාව 2012</u>

1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32(1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(1) වගන්තිය ප්‍රකාර 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පහත සඳහන් ලේඛනයන් ද සමඟ සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2012 වසරේ සංස්ථාව විසින් කරන ලද කාර්යයන් හා අදාල ප්‍රකාශ
2. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සංස්ථාවේ ලාභාලාභ ගිණුම, ආශ්‍රිත සටහන් හා එදිනට ශේෂ පත්‍රය
3. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණකාධිපති වාර්තාව
4. විගණකාධිපති විසින් ගිණුම් පිළිබඳ දක්වන අදහස්වලට සංස්ථා සභාපති විසින් සැපයූ පිළිතුරු

මෙයට,
විශ්වාසී වූ,

නීතිඥ අශෝක සේරසිංහ
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

## පාලන වාර්තාව


01. හැඳින්වීම
02. අධ්‍යක්ෂ මණ්ඩලය
03. දේශීය චිත්‍රපට නිෂ්පාදනය
04. පිරිස් හා ආයතන පාලනය
05. චිත්‍රපට ප්‍රචාරණය / සිනෙඇඩ්ස්
06. චිත්‍රපට ආනයනය
07. චිත්‍රපට ප්‍රදර්ශනය
08. අභ්‍යන්තර විගණන කටයුතු
09. සිනමා සංස්කෘතික හා අධ්‍යයන කටයුතු
10. දේශීය සැපයුම්, ආනයන හා අපනයන
11. චිත්‍රපට ගබඩාව
12. නෛතික කටයුතු
13. චිත්‍රපට සංස්ථා සිනමා ශාලාව
14. මූල්‍ය කටයුතු
15. චිත්‍රාගාරය
16. පරීක්ෂණ කටයුතු
17. සුභසාධනය
18. ක්‍රීඩා සංගමය
19. ආගමික කටයුතු
20. වෛද්‍ය සහනාධාර ක්‍රමය
21. වෘත්තිය සමිති
22. ස්තුතිය

## 01. හැදින්වීම

1980 අංක 45 දරන පනතින් සංශෝධනය කළ 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32(1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය යටතේ ගරු ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2012 වර්ෂය පිළිබඳ වාර්තාව

2012 වර්ෂය පිළිබඳ ඉදිරිපත් කරන මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 41 වන ක්‍රියාත්මක වර්ෂයට අදාළ වේ.

## 02. අධ්‍යක්ෂ මණ්ඩලය

**2.1 2012 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.**

| | |
|---|---|
| නීතිඥ අශෝක සේරසිංහ මහතා | -සභාපති |
| නීතිඥ ඩී. කරුණාරත්න මහතා | -ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| මහාචාර්ය ආරියරත්න ඇතුගල | -අ.ම. සාමාජික (නිල බලයෙන්) - රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ |
| නීතිඥ සමන්ත වැලිවේරිය මහතා | -අ.ම. සාමාජික (නිල බලයෙන්) - අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව |
| විජිත් කණුගල මහතා | -අ.ම. සාමාජික (නිල බලයෙන්) - අධ්‍යක්ෂ - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව |
| මහාචාර්ය රෝලන්ඩ් අබේපාල | -අ.ම. සාමාජික |
| ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර | -අ.ම. සාමාජික |
| ආචාර්ය ඩී. වෙන්කටේෂ්වරන් | - අ.ම. සාමාජික |
| රේණුකා බාලසූර්ය මහත්මිය | -අ.ම. සාමාජිකා |
| මාලනී ගමගේ මහත්මිය | - භාණ්ඩාගාර නියෝජිත |
| නීතිඥ වත්සලා වික්‍රමආරච්චි මහත්මිය | - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් |

## 03. දේශීය චිත්‍රපට නිෂ්පාදනය

### 3.1 දේශීය චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කිරීම

2012 වර්ෂය සඳහා ලියාපදිංචි කරන ලද චිත්‍රපට සංඛ්‍යාව 36 කි. ලියාපදිංචි චිත්‍රපට අතුරින් ප්‍රදර්ශනය කල චිත්‍රපට සංඛ්‍යාව 02 කි. චිත්‍රපටයක් සඳහා ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු. 2000/- ක මුදලක් අයකර ගනු ලැබේ.

## 3.2 දේශීය චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබා දෙනු ලබන ණය පහසුකම්

### 3.2.1 චිත්‍රාගාර සේවා ණය පහසුකම්

පහත සඳහන් චිත්‍රපට සඳහා මෙම ණය මුදල ලබා දී ඇත. අනුමත චිත්‍රාගාර සේවා වටිනාකම රු. 400,000/- කි.

- ක්වෙසරා සරා
- පරපුර
- ආදර පූජාසනේ
- ඔළුව ජපන් කඳ ජර්මන්
- පීටර් වන්

### 3.2.2 චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය පහසුකම් ලබාදීම

වර්ෂය තුල නිෂ්පාදන ණය පහසුකම් ලබාදී නොමැත.

### 3.2.3 විශේෂ ණය පහසුකම් ලබාදීම

වර්ෂය තුල විශේෂ ණය පහසුකම් ලබාදී නොමැත.

### 3.2.4 පිටපත් මුද්‍රණය සඳහා ණය පහසුකම් ලබාදීම

**"විජය කුවේණි "** චිත්‍රපටය සඳහා රු.මි. 05 ක ණය පහසුකම් ලබා දී ඇත.

### 3.2.5 ප්‍රචාරක ණය පහසුකම් ලබාදීම

වර්ෂය තුල ප්‍රචාරක ණය පහසුකම් ලබාදී නොමැත.

### 3.2.6 උප ශීර්ෂ පාඨ යෙදීම සඳහා ණය පහසුකම් ලබාදීම

වර්ෂය තුල උප ශීර්ෂ පාඨ යෙදීම සඳහා ණය පහසුකම් ලබා දී නොමැත.

### 3.2.7 චිත්‍රපට වර්ගීකරණ කමිටුව

පිටපත් මුද්‍රණය, ප්‍රචාරක ණය හා විශේෂ ණය පහසුකම් ලබා දෙන්නේ වර්ගීකරණ කමිටුවේ නිර්දේශ අනුවය.

## 3.3 කාර්මික ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ නව හැඳුනුම් පත් නිකුත් කිරීම

කාර්මික ශිල්පීන් දෙදෙනෙකු ලියාපදිංචි කර නව හැඳුනුම්පත් නිකුත් කර ඇත.

### 3.4 <u>දේශීය චිත්‍රපට නිෂ්පාදනය සඳහා විදේශීය නළු-නිළි කාර්මික ශිල්පීන් යොදවා ගැනිම වෙනුවෙන් අය කිරිම</u>

සදේශ් කුමාර් විසින් නිෂ්පාදනය කරන ලද **"කාංචනා "** හා ප්‍රසන්න විතානගේ නිෂ්පාදනය කරන ලද **"ඔබ නැතුව ඔබ එක්ක"** චිත්‍රපටවල විදේශීය ශිල්පීන් සඳහා අනුමත ගාස්තු අයකර ගෙන ඇත.

### 3.5 <u>දේශීය වෘතාන්ත/වෙළඳ/වාර්තා වැඩ සටහන් රූගත කිරීම සඳහා කැමරා උපකරණ ලබාගැනීම අනුමත කිරීම වෙනුවෙන් කරනු ලබන අය කිරීම්</u>

- මෙරට නිෂ්පාදනය කරනු ලබන වෙළඳ වැඩසටහන් 09 ක් වෙනුවෙන් අනුමත ගාස්තුව අයකර ගෙන ඇත.
- ඉහත වැඩ සටහන් සහ විදේශ චිත්‍රපට රූගත කිරම සඳහා විදේශයන් ගෙන් කැමරා උපකරණ ගෙන්වා ගැනීම වෙනුවෙන් ආයතන 07 කින් අනුමත ගාස්තුව අයකර ගෙන ඇත.

### 3.6 <u>දේශීය / විදේශීය සිනමා උළෙල පැවැත්වීම</u>

- වියට්නාම් තානාපති කාර්යාලය විසින් 2012.02.05 සිට 2012.02.20 දින දක්වා ශ්‍රී ලංකා වියට්නාම් චිත්‍රපට උළෙල සංස්ථා සිනමාශාලාවේදි පවත්වන ලදි.

- ශ්‍රී ලංකාවේ සාක් සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සාක් චිත්‍රපට උළෙල - කොළඹ යනුවෙන් චිත්‍රපට උළෙලක් 2012.05.15සිට 2012.05.20 දක්වා පවත්වන ලදි. මෙහිදී ශ්‍රී ලංකාවේ චිත්‍රපට දෙකක් ඇතුළුව ඉන්දියාව, පකිස්ථානය, බංගලදේශය, මාලදිවයින යන රටවල චිත්‍රපට ප්‍රදර්ශනය කරන ලදි.

- යුරෝපීය සංගමය විසින් පවත්වනු ලබන යුරෝපා රටවල සිනමා උළෙල සංස්ථා සිනමාශාලාවේදී 2012.12.02 සිට 2012.12.07 දක්වා පවත්වන ලදි.

- ඉන්දියාවේ පැවති කේරළ අන්තර්ජාතික සිනමා උළෙල සඳහා **"ඉනි අවන් "**, **"ඔබ නැතුව ඔබ එක්ක"**, **"සමනල සංධ්වනිය "**සහ **"කර්ම "** යන චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලද අතර, එම උළෙලට සංස්ථා සභාපති සහභාගි විය.

### 3.7 <u>ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල</u>

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ පාලක මණ්ඩල සාමාජකයන් පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| නීතිඥ අශෝක සේරසිංහ මහතා | - | සභාපති |
| නීතිඥ ඩී. කරුණාරත්න මහතා | - | ක්‍රියාකාර් අධ්‍යක්ෂ |
| මහාචාර්ය ආර්යරත්න ඇතුගල | - | පාලක මණ්ඩල සාමාජක |
| මහාචාර්ය රෝලන්ඩ් අබේපාල | - | එම |

| | | |
|---|---|---|
| ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර | - | එම |
| නීතිඥ සමන්ත වැලිවේරිය මහතා | - | එම |
| විජිත් කණුගල මහතා | - | එම |
| මාලනී ගමගේ මහත්මිය | - | එම |
| කේ.ඩබ්ලිව්.ටී.එන්. අමරතුංග මහත්මිය | - | එම |
| ආචාර්ය ඩී. වෙන්කටේෂ්වරන් | - | එම |
| රේණුකා බාලසූර්ය මහත්මිය | - | එම |

## 3.8 විදේශ වෘතාන්ත / වාර්තා / වෙළඳ වැඩ සටහන් රූගත කිරීම සඳහා අවසර ලබාදීම

- වාර්තා චිත්‍රපට 28 ක් වෙනුවෙන් අනුමත ගාස්තුව අයකර ගෙන ඇත.
- වෙළඳ වැඩ සටහන් 10 ක් වෙනුවෙන් අනුමත ගාස්තුව අයකර ගෙන ඇත.
- වෘතාන්ත චිත්‍රපට 05 ක් වෙනුවෙන් අනුමත ගාස්තුව අයකර ගෙන ඇත.
- ඉහත රූගත කිරීම් වෙනුවෙන් විදේශයන්ගෙන් පැමිණෙන අතිරේක ශිල්පීන් වෙනුවෙන් අනුමත ගාස්තුව අයකර ගෙන ඇත.

## 3.9 චිත්‍රපට කලාකරුවන් සහ කාර්මිකයන් සඳහා වූ සංස්ථා භාරය

සංස්ථා භාරයේ නව භාරකාර මණ්ඩලය පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| නීතිඥ අශෝක සේරසිංහ මහතා | - | සභාපති |
| නීතිඥ ඩී. කරුණාරත්න මහතා | - | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| වී. වාමදේවන් මහතා | - | භාරකාර මණ්ඩල සාමාජික |
| රේණුකා බාලසූර්ය මහත්මිය | - | එම |
| සුදන්ත තිලකසිරි මහතා | - | එම |
| අර්ජුන කමලනාත් මහතා | - | එම |
| රොජර් සෙනෙවිරත්න මහතා | - | එම |
| සනත් ගුණතිලක මහතා | - | එම |
| ලාල් වීරසිංහ මහතා | - | එම |
| ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර | - | විකල්ප සාමාජික |

### 3.9.1 විශ්‍රාම වැටුප් ගෙවීම

විශ්‍රාම වැටුප් ගෙවීම: එක් අයෙකුට රු:2,000/- බැගින්

- ජනවාරි - මාර්තු රු: 270,000.00
- අප්‍රේල් - දෙසැම්බර් රු: 756,000.00

3.9.2 2012 වසර තුළ මිය ගිය විශ්‍රාමලාභීන්

- එම්.ඩබ්. ගුණසේකර මහතා

3.9.3 **මෙම වර්ෂය තුල නව විශ්‍රාමලාභින් බඳවා ගෙන නොමැත.**

මරණාධාර මුදල් ලබාදීම

එම්.ඩබ්. ගුණසේකර මහතා වෙනුවෙන් නීත්‍යානුකූල භාරකරුවන් වෙත "මරණාධාර දීමනා" ගෙවා ඇත.

## 04. පිරිස් හා ආයතන පාලනය

### 4.1 කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| 2012.01.01 දිනට සේවක සංඛ්‍යාව | | - 162 |
| 2012 වර්ෂය තුළ බඳවාගත් සංඛ්‍යාව | | - 0 |
| | | 162 |
| **2012 වර්ෂය තුල ඉවත් වූ සංඛ්‍යාව** | | |
| විශ්‍රාම ලැබූ සංඛ්‍යාව | - 12 | |
| සේවයෙන් ඉල්ලා අස්වූ සංඛ්‍යාව | - 02 | |
| ඉවත් වූ මුළු සේවක සංඛ්‍යාව | | - 14 |
| ස්ථිර කාර්ය මණ්ඩලය | | 148 |
| වෙනත් | | |
| කොන්ත්‍රාත් | | - 05 |
| දෛනික දීමනා | | - 01 |
| පුහුණු | | - 03 |
| 2012.12.31 දිනට මුළු සේවක සංඛ්‍යාව | | - 157 |
| | | === |

### 4.2 ආයතන පාලනය හා සේවක අවශ්‍යතා ඉටු කිරීම

ආයතනයේ සේවක පාලනයට අදාලව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යමින් සේවා කටයුතු ඉටු කර ඇත.

## 05. චිත්‍රපට ප්‍රචාරණය / සිනෙ ඇඩ්ස්

### 5.1 වසර තුල ඉටුකල කාර්යභාරය

- විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් චිත්‍රපට ප්‍රචාරක කටයුතු අදාල සිනමාශාලා හා චිත්‍රපට නිෂ්පාදකයන් වෙත ඉටු කර දීම හා පෞද්ගලික ප්‍රචාරක ආයතන සමඟ තරඟකාරීත්වයට මුහුණ දෙමින් සිනෙ ඇඩ්ස් ප්‍රචාරක අංශය, සිනමාශාලා ප්‍රචාරක දැන්වීම් දෛනිකව පුවත්පත්වල පළ කිරීම තුලින් සේවාදායකයාගෙන් 10% ක සේවා ගාස්තුවක් සහ ආයතන වලින් 15% ක කොමිස් මුදලක් ලබා ගැනීම.

- සංස්ථා පරිශ්‍රය ඉදිරිපිට හා දළුගම සරසවි චිත්‍රාගාරය ඉදිරිපිට මුදල් අයකර චිත්‍රපට ප්‍රචාරක පුවරු (Cut Outs) ප්‍රදර්ශනය කිරීම.

- එදිනෙදා ප්‍රදර්ශනය වන හා ඉදිරියට ප්‍රදර්ශනයට අනුපෙළ ගන්වා ඇති චිත්‍රපට පිළිබඳව ප්‍රේක්ෂකයන් දැනුවත් කිරීම හා චිත්‍රපට සඳහා පූර්ව ප්‍රචාරයක් ලබාදීමක් ලෙස සෑම ඉරිදා දිනකම පෙ.ව. 10.00 සිට පෙ.ව. 10.30 දක්වා පැය 1/2 ක ගුවන් විදුලි සිනමා ප්‍රචාරාත්මක වැඩසටහනක් **"රිදී තිරය"** නමින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වෙළඳ සේවයේ ප්‍රචාරය කිරීම.

- සිනමා කර්මාන්තයේ අභිවෘද්ධිය පෙරදැරි කරගෙන (සිනමා කර්මාන්තයට අදාළ සියළු සේවාවන් ඇතුලත් ) දුරකථන නාමාවලියක් මුද්‍රණය කිරීම.

- සංස්ථාවේ සියළුම මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම.

- මාධ්‍යවේදීන්ට, සිනමා විචාරකයින්ට හා විද්වතුන්ට චිත්‍රපට නැරඹීම සඳහා නොමිලයේ චිත්‍රපට නැරඹීමේ අවසර පත් නිකුත් කිරීම.

- දේශීය සිනමාවේ 65 වන සමරු උළෙල වෙනුවෙන් **"සිරිසේන විමලවීර"** සිනමාවේදියා ඇගයීම සඳහා පැවති උත්සවයේ සියළුම මාධ්‍ය කටයුතු ඉටු කිරීම.

- **"දැයට කිරුළ "** අධ්‍යාපනික සංවර්ධන ප්‍රදර්ශනයේ ජාතික චිත්‍රපට සංස්ථාවේ ප්‍රදර්ශන කුටියේ ප්‍රචාරක කටයුතු ඉටු කිරීම.

- ජාතික චිත්‍රපට සංස්ථාව ඉරාන තානාපති කාර්යාලය සමඟ ඒකාබද්ධ පවත්වන ලද **"ඉරාන චිත්‍රපට උළෙල"** වෙනුවෙන් මාධ්‍ය ප්‍රචාරක කටයුතු ඉටු කිරීම.

- ජාත්‍යන්තර ලෝක ළමා දිනයට සමගාමීව ඔක්තෝම්බර් 01 දින දිවයිනේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි තෝරාගත් සිනමාහල් කිහිපයක පෙ.ව 8.00 ට විශේෂ දර්ශනයක් (ළමා චිත්‍රපටයක්) පාසැල් ළමුන් වෙනුවෙන් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් මාධ්‍ය ප්‍රචාරක කටයුතු සිදු කිරීම.

## 5.2 <u>වර්ෂය තුල ප්‍රගතිය</u>

- විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ප්‍රචාරක කටයුතු ඉටු කිරීම වෙනුවෙන් රු. 952,000/- ක ආදායමක් උපයාගෙන ඇති අතර, සංස්ථාවට අදාල සියළුම පුවත්පත් දැන්වීම් ඉහළ කළමනාකාරත්වයේ අනුමැතිය යටතේ පුවත්පත් වල පල කිරීමෙන් සිනෙ ඇඩ්ස් මගින් කොමිස් මුදලක් ලෙස රු. 100,000/- ට වැඩි මුදලක් සංස්ථාවට ඉතිරි කර දී ඇත.

- එළිමහන් පූර්ව ප්‍රචාරයන් ලෙස චිත්‍රපට ප්‍රචාරක පුවරු සංස්ථා භූමියේ ප්‍රදර්ශනය කිරීම මගින් රු. 500,000 ක පමණ ආදායමක් උපයාගෙන ඇත.

- රිදී තිරය ගුවන් විදුලි වැඩ සටහන මගින් වර්ෂයේ කොමිස් ආදායම වශයෙන් රු. 79,800 ක් උපයාගෙන ඇත.

- සිනමා ශිල්පී දුරකථන නාමාවලියේ ඇතුලත් කිරීම සඳහා රු. 160,000/- ක පමණ අනුග්‍රාහක දැන්වීම් ලැබී ඇති අතර, දුරකථන නාමාවලිය අලෙවි කිරීම මගින් රු. 40,000/- ක පමණ ආදායමක් ලැබී ඇත.

## 06. චිත්‍රපට ආනයනය

වසර තුල ලියාපදිංචි ආනයනකරුවන් සංඛ්‍යාව - 37 කි. වසර තුල ආනයනය කිරීමට අනුමැතිය ලබා දී ඇති චිත්‍රපට සංඛ්‍යාව පහත පරිදි වේ.

| චිත්‍රපට වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| දමිළ | 69 |
| ඉංග්‍රීසි | 54 |
| හින්දි | 14 |
| වෙනත් | 01 |

## 07. චිත්‍රපට ප්‍රදර්ශනය

### 7.1 සංස්ථා ප්‍රදර්ශන මණ්ඩලය (රිත්මා එන්ටප්‍රයිසස්)

1. චිත්‍රපට ප්‍රදර්ශනය

- 2012 වර්ෂය තුල රිත්මා මණ්ඩලයේ සිනමාශාලා 58 ක් ක්‍රියාත්මක වේ. වසාදමා තිබූ පුන්දළුඔය - ප්‍රගාෂ් සිනමාශාලාව නැවත විවෘත කර ඇති අතර, අළුතින් ඉදිකල මහරගම - "ඇම්ප් ලයිට්" සිනමාශාලාව රිත්මා මණ්ඩලය යටතේ 2012 වර්ෂයේ දී චිත්‍රපට ප්‍රදර්ශනය ආරම්භ කර ඇත. තවද, නුගේගොඩ ප්‍රදේශයේ නව සිනමාහලක් ඉදිකිරීම සඳහා සංස්ථා අනුමැතිය ලබා දී ඇත.

2. චිත්‍රපට මුදා හැරීම

- 2012 වර්ෂය තුල රිත්මා මණ්ඩලය යටතේ සිනමාශාලා 58 ක චිත්‍රපට ප්‍රදර්ශනය කර ඇති අතර, රිත්මා මණ්ඩලය සහ අනෙකුත් මණ්ඩල සමඟ ඒකාබද්ධ වී චිත්‍රපට මුදාහැරීමට කටයුතු කර ඇත.

- රිත්මා මණ්ඩලය මගින් සිංහල චිත්‍රපට 03 ක් මුදා හැර ඇත. මෙම වර්ෂයේ ජනවාරි සිට සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද දෙමළ චිත්‍රපට 15 ක් හා ඉංග්‍රීසි චිත්‍රපට 03 ක් රිත්මා මණ්ඩලය හා අනෙකුත් මණ්ඩල සිනමාශාලා ඒකාබද්ධ වී මුදාහැරීමට කටයුතු කර ඇත. සංස්ථා රිත්මා මණ්ඩලය වෙත ලබා දී ඇති කොටසින් හා අනෙකුත් මණ්ඩලවල කොටස්වලින් චිත්‍රපට ලබාගෙන රිත්මා මණ්ඩලය විසින් චිත්‍රපට මුදාහැරීමට කටයුතු කර ඇත.

3. <u>චිත්‍රපට කුලිය</u>

- රිත්මා මණ්ඩලය විසින් අනෙකුත් මණ්ඩලවලට සපයන ලද චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි චිත්‍රපට කුලී මුදල් ලැබී ඇත. (2011 සැප්තැම්බර් මස දක්වා)

| | |
|---|---|
| CEL | 15,112,025.72 |
| EAP | 2,446,221.67 |
| LFD | 6,642,131.51 |
| MPI | 8,253,274.80 |

- රිත්මා මණ්ඩලය අනෙකුත් මණ්ඩලවලින් ලබාගත් චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි මුදල් ගෙවා ඇත. (2011 සැප්තැම්බර් මස දක්වා)

| | |
|---|---|
| CEL | 10,597,641.79 |
| EAP | 17,864,364.90 |
| LFD | 3,832,162.03 |
| MPI | 4,144,790.61 |

2012 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කොමිස් මුදල දළ වශයෙන් රු. 18,381,899.40 කි.

4. <u>රිපෝ තැන්පතු</u>

2012 ජනවාරි සිට ජුනි මස වන විට රු.22,000,000.00 ක තැන්පතු ඇත.

5. <u>සංස්ථා භාරය</u>

- සංස්ථා භාරය වශයෙන් 2012 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා රු. 4,276,905.70 ක මුදලක් රිත්මා මණ්ඩලය විසින් සංස්ථාවට ගෙවා ඇත.

6. <u>ආධාර දර්ශන</u>

- විවිධ සමිති සමාගම් හා විශ්වවිද්‍යාල හා පාසැල් සිසුන් සඳහා සහන මිලක් යටතේ ආධාර ලබාගැනීම සඳහා චිත්‍රපට ලබා දී ඇති අතර, යාපනය හමුදා කඳවුර සඳහා නොමිලේ චිත්‍රපට ලබාදීම හා පොලිස් අභ්‍යාස විද්‍යාල හා ඒ ආශ්‍රිත ආයතන සඳහා සහන මිලකට චිත්‍රපට ලබාදීම කර ඇත.

- 2012 දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශන භූමියේ ප්‍රදර්ශනය කිරීම සඳහා චිත්‍රපට ලබා දීම.

- ලෝක ළමා දිනය වෙනුවෙන් ප්‍රධාන නගර ආවරණය වන පරිදි අනෙකුත් මණ්ඩල ද සම්බන්ධ කර ගනිමින් චිත්‍රපට උළෙලක් පවත්වා ඇත.

## 08. <u>අභ්‍යන්තර විගණන කටයුතු</u>

අභ්‍යන්තර විගණන කටයුතු 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධාන වලට අනුකූලව හා විගණකාධිපතිගේ අවධානයට යටත්ව සිදු කර ඇත.

වර්ෂය තුල ක්‍රියාත්මක විගණන හා කළමනාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයන් ගෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| මාලනී ගමගේ මහත්මිය | - මහාභාණ්ඩාගාර නියෝජිත | - කමිටු සභාපති |
| මහාචාර්ය රෝලන්ඩ් අබේපාල | - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | - කමිටු සාමාජික |
| ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර | - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | - කමිටු සාමාජික |
| කේ.සී.පී. සේනාරත්න මිය | - විගණකාධිපති දෙපාර්තමේන්තුව | - නිරීක්ෂක |
| ඩබ්. ශ්‍රියානි හංවැල්ල මහත්මිය | - අභ්‍යන්තර විගණක | - කමිටු ලේකම් |

වසර තුල විගණන හා කළමනාකරණ රැස්වීම් වාර 05 ක් පවත්වා ඇත.

## 09. සිනමා සංස්කෘතික හා අධ්‍යාපන කටයුතු

### 9.1 සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලා

ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව - 38
පාඨමාලාව හැදෑරූ සිසුන් සංඛ්‍යාව - 33

පාඨමාලාවේ පළමු අදියර වාචික පරීක්ෂණය සහ ලිඛිත පරීක්ෂණ අවසන් කර ප්‍රතිඵල නිකුත් කර ඇත. දෙවන අදියර දේශන අවසන් කරමින් පවතී.

### 9.2 සිනමා රසවින්දන වැඩසටහන්

- දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයට පූර්වගාමීව අම්පාර දිස්ත්‍රික්කයේ අම්පාර අධ්‍යාපන කලාපයේ පාසැල් කේන්ද්‍රකරගනිමින් නොමිලයේ රසවින්දන වැඩ සටහන් සිදු කිරීම.
- 2012.05.15 දින කොළඹ 07, පොලිස් අපරාධ වාර්තා කොට්ඨාශ වෙනුවෙන් නොමිලයේ රසවින්දන වැඩසටහනක් පැවැත්වීම.
- 2012.05.25 දින මහනුවර නීතිඥ සංගමය වෙනුවෙන් රසවින්දන වැඩසටහනක් පැවැත්වීම. මේ සඳහා රු. 8800/- ක මුදලක් අයකර ගෙන ඇත.

### 9.3 චිත්‍රපට ප්‍රදර්ශනය

- 2012.05.12 කළුතර , එතනමඩල, ජාවත්ත බෞද්ධ හා පොදු සමාජ සේවා සමිතිය වෙනුවෙන් "අංගුලිමාල" සහ "අබා" චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීම. අයකරන ලද මුදල රු. 8000/- කි.
- 2012.09.18 දින කැළණිය ප්‍රාදේශීය සභාවේ "කල්‍යානි කලා ප්‍රසාදිනී" කලා ප්‍රසංගය සඳහා "තුංමං හන්දිය", "වීරපුරන්අප්පු", "සාරවිට", චිත්‍රපට නොමිලයේ ප්‍රදර්ශනය කිරීම.

- සංස්කෘතික අමාත්‍යාංශයේ සහිත්‍ය කලා මහෝත්සවය වෙනුවෙන් "හංසවිලක් ", "සාරවිට", "පරසතුමල්", "වීරපුරන් අප්පු", "තුංමංහන්දිය", චිත්‍රපට සියනෑ අධ්‍යාපන පීඨයේ දී ප්‍රදර්ශනය කිරීම. ඒ සඳහා අය කරන ලද මුදල රු. 17,000/- කි.

### 9.4 <u>චිත්‍රපට සඟරාව</u>

2012 ජනවාරි - අප්‍රේල් **"චිත්‍රපට සිනමා ශාස්ත්‍රී සඟරාව"** චතුර් මාසික කලාපය නිකුත් කර ඇති අතර සඟරා 60 ක් අලෙවි කිරීමට කටයුතු කර ඇත.

### 9.5 <u>දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය</u>

- 2012.02.04 දින සිට 2012.02.12 දින දක්වා අනුරාධපුර - ඔයාමඩුව ප්‍රදේශයේදී පවත්වන ලද මෙම සංවර්ධන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලද සංස්ථා ප්‍රදර්ශන කුටිය, මාධ්‍ය කලාපයේ ප්‍රදර්ශන කුටි අතරින් ඉහළ ප්‍රතිචාරයක් හිමිකර ගත් අතර, මාධ්‍ය අමාත්‍යාංශයේ ඇගයීමට ද ලක්විය.

- ප්‍රදර්ශනය භූමියේ ප්‍රචාරක ආදායම් වශයෙන් රු. 29,700/- ක මුදලක් උපයා ගෙන ඇත.

## 10. <u>දේශීය සැපයුම්, ආනයන හා අපනයන</u>

### 10.1 <u>වර්ෂය තුල ඉටුකරන ලද සේවාවන්</u>

- සිනමා ශාලාවල ප්‍රයෝජනය සඳහා කාබන් මිලදී ගෙන අලෙවි කිරීම. අලෙවි ආදායම රු. 6,430,235.69 කි.

- දළුගම සරසවි චිත්‍රාගාරයේ ශබ්ද අංශය සඳහා නව Avid Mojo යන්ත්‍රයක් මිලදී ගැනීම. වැය වූ මුදල රු. 492,800.00 කි.

- දළුගම සරසවි චිත්‍රාගාරය සඳහා වායු සමීකරණ යන්ත්‍ර 05 ක් මිලට ගැනීම. වැය වූ මුදල රු.647,001.60 කි.

- සංස්ථා පරිහරණයට සහ දළුගම සරසවි චිත්‍රාගාරයට ඇඟිලි සළකුණු යන්ත්‍ර 04 ක් මිලට ගැනීම. වැය වූ මුදල රු. 323,652.00 කි.

- අංක 303, ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඉදිකිරීමට යෝජිත නව කාර්යාල ගොඩනැගිල් සඳහා ටෙන්ඩර් කැඳවීම.

- දළුගම සරසවි චිත්‍රාගාරය සඳහා Dehumidi Fiers යන්ත්‍ර 03 ක් සහ Supply Timer Circuit 03 ක් මිලට ගැනීම. වැය වූ මුදල රු. 772, 800.00 කි.

- සංස්ථාවේ විවිධ අංශ වල පරිහරණය සඳහා අවශ්‍ය කාර්යාලීය උපකරණ, ලිපි ද්‍රව්‍ය හා දෛනික රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය විවිධ භාණ්ඩ (පරිගණක ඇතුළුව) සැපයීම.

- සංස්ථාවේ 303, 224 සහ දළුගම චිත්‍රාගාර කාර්යාල පරිශ්‍රයන්ට අවශ්‍ය සනීපාරක්ෂක හා ආරක්ෂක සේවා සැපයීම.

# 11. චිත්‍රපට ගබඩාව

## 11.1 කාර්යභාරය

- චිත්‍රපට සංස්ථාවේ අවසරය මත ආනයනය කරනු ලබන විදේශීය චිත්‍රපට හා දේශීයව නිෂ්පාදනය කරනු ලබන චිත්‍රපට භාරගෙන ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම.

- එම චිත්‍රපටවල තත්ත්වය පරීක්ෂා කර, රැඟුම් පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීම හා එහි අනුමැතිය ලැබීමෙන් පසු නැවත තත්ත්ව වාර්තා ලබාගෙන ආනයනකරු/නිෂ්පාදක/බෙදාහැරීමේ මණ්ඩලය වෙත භාරදීම හා සිනමාශාලා වෙත බෙදාහැරීම.

- සංස්ථා මණ්ඩලය මගින් අනුපෙළ ගන්වනු ලබන චිත්‍රපට නියමිත සිනමාශාලා වෙත යැවීම හා නැවත නිසි පරිදි ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.

- එම චිත්‍රපට වලට අදාළ ප්‍රචාරක ද්‍රව්‍ය සිනමා ශාලා වෙත නිකුත් කිරීම.

- චිත්‍රපට ගබඩාව වෙත ලැබෙන සියළුම චිත්‍රපට නැවත පරීක්ෂා කොට ආරක්ෂිතව රාක්ක ගත කිරීම.

- රාක්ක ගතකර ඇති චිත්‍රපට විටින් විට පරීක්ෂාවට ලක් කිරීම.

- උක්ත කාර්යයන් අදාලව ලිපි ගොනු පවත්වාගෙන යාම.

- චිත්‍රපට ගබඩාවට ලැබෙන සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ හින්දි චිත්‍රපට තත්ත්ව පරීක්ෂා කිරීම මගින් ආදායම් ඉපැයීම.

# 12. නෛතික කටයුතු

## 12.1 කාර්යභාරය

- සංස්ථාව පාර්ශවයන් වන නඩු සම්බන්ධයෙන් සංස්ථාව වෙනුවෙන් පෙරකලාසි ගොනුකිරීම හා අධිකරණයේ පෙනී සිටීම.

- සංස්ථාව වෙනුවෙන් කම්කරු විනිශ්චය සභා, කම්කරු දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම.

- සංස්ථාව පාර්ශවයන් වනු ලබන සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම.

- ජාතික චිත්‍රපට සංස්ථා පනත සංශෝධනය කිරීම් කටයුතු සම්බන්ධයෙන් පියවර ගැනීම.
- සංස්ථාවේ අභ්‍යන්තර විනය පරීක්ෂණ කටයුතු සිදු කිරීම.

### 12.2 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින නඩු

- අභියාචනාධිකරණ නඩු අංක : 590/2007
- කොළඹ දිසා අධිකරණ නඩු අංක : DMR 1897/11
- අභියාචනාධිකරණ නඩු අංක : 870/99
- කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 18/2012
- කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක : 97659/5/11
- ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක : SC(FR) 475/2012
- දිසා අධිකරණ නඩු අංක : DMR 1126/2012 - සිසෙනසිටි සිනමාහල් 04න් සංස්ථාවට ගෙවිය යුතු සංස්ථා භාරය නොගෙවීම සම්බන්ධයෙන්
- දිසා අධිකරණ නඩු අංක : DMR 2756/2012 "උඩුගංයාමය" චිත්‍රපටය නිෂ්පාදනය සඳහා සංස්ථාවෙන් ලබාගත් ණය මුදල නොගෙවීම සම්බන්ධයෙන්

**කම්කරු දෙපාර්තමේන්තුවේ පැවති පරීක්ෂණ :**

- සංස්ථා සේවක - ඩබ්.එස්. ෆොන්සේකා මහතා
- කම්කරු කාර්යාල පැමිණිලි අංකය - IR/15/19/2012 - චිත්‍රපට සංස්ථා සේවක සංගමය - සමිත දිසානායක මහතා
- කම්කරු කාර්යාල පැමිණිලි අංකය - IR/15/20/2012 - කේ.ජී.ඩී. බන්දුසේන මහතා
- කම්කරු කාර්යාල පැමිණිලි අංකය - CCC/කා.ආ/719/2012 - ටී.එස්. ප්‍රසන්න පීරිස් මහතා

## 13. චිත්‍රපට සංස්ථා සිනමාශාලාව

පහත සඳහන් චිත්‍රපට උළෙලයන් සංස්ථා සිනමාහලේ දී පවත්වා ඇත.

- ඉරාන චිත්‍රපට උළෙල
- වියට්නාම් චිත්‍රපට උළෙල
- සාක් චිත්‍රපට උළෙල
- කෙටි චිත්‍රපට උළෙල
- යුරෝපා චිත්‍රපට උළෙල
- ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ සමාජ ඒකාබද්ධතා සිනමා සතිය
- ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය ලෝක කාන්තා දිනයට සමගාමීව කරන ලද චිත්‍රපට ප්‍රදර්ශනය
- මුහුරත් උළෙලයන් පැවැත්වීම.
- ලෝක ළමා දිනයට සමගාමීව චිත්‍රපටයක් ප්‍රදර්ශනය කිරීම.

## 14. මූල්‍ය කටයුතු

14.1 2011 වසර සමඟ සංසන්දනය කරන විට සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පහත සඳහන් වේ.

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| ප්‍රදර්ශණයෙන් ලත් ආදායම | 37,648,738.00 | 37,267,082.00 |
| සිනමා කාබන් විකිණීම | 2,343,081.00 | 2,311,824.00 |
| අමතර කොටස් විකිණීම | 127,972.00 | 57,701.00 |
| ලිපි ද්‍රව්‍ය | 1,497,874.00 | 1,497,925.00 |
| සිනේ ඇඩ්ස් | 809,831.00 | 611,064.00 |
| චිත්‍රාගාරය | 3,851,248.00 | 5,750,618.00 |
| ශුද්ධ ලාභය | 3,512,189.00 | 2,417,937.00 |

14.2 2012 වර්ෂයේ විකුණුම් ආදායම රුපියල මිලියන 46 කි. එය 2011 වර්ෂයේ රුපියල් මිලියන 47.5 ක් වූ අතර, 2012 වර්ෂයේ දී ලැබූ ආදායම 2011 වර්ෂයට වඩා මිලියන 1.5 කින් අඩු වී ඇත. මෙයට හේතු වී ඇත්තේ චිත්‍රාගාරයේ ආදායම අඩුවීම සහ විදේශීය චිත්‍රපට ආනයනය නොකිරීම නිසා චිත්‍රපට කුලී ආදායම අඩුවීම වේ.

එමෙන්ම අනෙකුත් ආදායම් මාර්ගයන් වන භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු පොලිය පසුගිය වර්ෂයට වඩා රු.මිලියන 4.2 කින් වැඩි වී ඇත. 2012 වර්ෂයේ පොලී ප්‍රතිශතය ඉහළ යාම එයට හේතු වී ඇත.

මෙම වර්ෂයේ සමස්ථ වියදම රු.මි 4 කින් අඩු වී ඇත. 2011 ට සාපේක්ෂව සේවක පාර්ශ්‍රමික රු. මිලියන 14.3 කින් අඩු වී ඇත. එයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ සේවකයින් 13 දෙනෙකු මෙම වර්ෂයේ විශ්‍රාම යාම සහ එයට අනුරූපීව සේවකයින් බඳවා ගැනීම සිදු නොකිරීමයි. සේවක පාර්ශ්‍රමික සඳහා 2011 වර්ෂයේ අර්ථසාධක අරමුදලට ගෙවීමට සිදුවේයැයි සලකා මිලියන 10 ක මුදලක් වෙන්කර ඇත.

### 14.3 බොල් ණය

2011 වර්ෂයට වඩා 2012 වර්ෂයේ බොල් ණය වෙන් කිරීම රු.මිලියන 19.5 ක වැඩිවීමක් කර ඇත්තේ සිනමාශාලා බෙදාහැරීමේ මණ්ඩල යටතට ගැනීමෙන් පසු සිනමාශාලා සැලකිය යුතු ප්‍රමාණයක් වසා දමා ඇති බැවිනි. එම සිනමාශාලා වෙතින් අයවිය යුතු මුදල් නොලැබේයැයි සලකා බොල් ණය වෙන් කර ඇත.

### 14.4 ස්ථාවර වත්කම්

2012 වර්ෂයේ කාර්යාල උපකරණ මිලදී ගැනීම් රු. මිලියන 3.6 කි. නොනිම් ප්‍රාග්ධන කාර්යයන් වූ චිත්‍රාගාර ගොඩනැගිල්ල සහ ප්‍රධාන කාර්යාල භූමියේ ඉදි කෙරෙන නව ගොඩනැගිල්ල සඳහා රු. මිලියන 12.7 ක් මෙම වර්ෂයේ වැය කර ඇත.මෙම වර්ෂය සඳහා ක්ෂය කිරීම් රු. මිලියන 17.7 ක් වේ.

## 14.5 ජංගම වත්කම්

පසුගිය වර්ෂයට සාපේක්ෂව ජංගම වත්කම් රු. මිලියන 29 කින් වැඩි වී ඇත. කෙටි කාලීන ආයෝජන 2011 වර්ෂයට වඩා වැඩි වී ඇත්තේ ආයෝජනය කර ඇති තැන්පතු සඳහා ලැබෙන පොලිය නැවත ආයෝජනය කිරීම සහ සිනමාශාලා හිමියන්ට ණය පදනම මත ලබාදීමට මිලදී ගෙන ඇති සිනමාශාලා ශබ්ද උපකරණවල වටිනාකම තොගයට එකතු කිරීම හේතුවෙනි. සිනමාහල් ණයගැති ශේෂය වැඩි වී ඇත්තේ සිනමාශාලාවලින් ලැබිය යුතු චිත්‍රපට කුලී ආදායම සහ සංස්ථා භාරය නොගෙවීම නිසා සහ නොගෙවන මුදල් ශේෂයට අධිභාරය අයකරන බැවිනි.

තැන්පතු හා ඉදිරි ගෙවීම් රු. මිලියන 19 කින් අඩු වී ඇත්තේ ඉදිකිරීම් කටයුතු සහ සේවාවන් නිසියාකාරව ඉටුකල පසු අත්තිකාරම් වශයෙන් කල ගෙවීම් අදාල වියදම් ගිණුම්වලට මාරු කිරීම හේතුවෙනි. ණයහිමියන් වෙත ගෙවිය යුතු චිත්‍රපට කුලිය ගෙවීම ප්‍රමාදවීම මත මුදල් ශේෂය රු. මිලියන 10 කින් වැඩි වී ඇත.

## 14.6 ජංගම වගකීම්

පසුගිය වර්ෂය සමඟ සැසදීමේදී රු.මිලියන 10 කින් වැඩි වී ඇත. එයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ චිත්‍රපට කුලී ණය හිමියන් වැඩිවීමය.

14.7 සේවක පාරිශ්‍රමිකය ගෙවනු ලබන්නේ භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් වලිනි. ඒ හේතුව මත වර්ෂයේ ආදායම් බදු වෙන් කිරීමක් කර නොමැත.

# 15. චිත්‍රාගාරය

පශ්චාත් නිෂ්පාදන අදියරේ පවතින චිත්‍රපට සඳහා කාර්මික සේවාවන් සහ පහසුකම් සැපයීම දළුගම සරසවි චිත්‍රාගාරයේ ප්‍රධාන කාර්යභාරය වේ.

ඒ අනුව සුපුරුදු පරිදි 2012 වසරේදීත් චිත්‍රාගාරයේ පහත සඳහන් අංශවලින් දේශීය චිත්‍රපට නිෂ්පාදකවරුන්ට අවශ්‍ය කාර්මික සේවාවන් සහ පහසුකම් සපයා ඇත.

1. ශබ්ද අංශය (Digital)
2. අරේඛීය සංස්කරණ අංශය (Digital)
3. සංස්කරණ අංශය (Analogue)
4. කළු/සුදු රසායනාගාරය
5. චිත්‍රපට සංරක්ෂණාගාරය
6. චිත්‍රපට හා රූපවාහිනී රූගත කිරීමේ මැදිරිය

## 15.1 ඉටු වී ඇති කාර්යභාරය

1. සරසවි චිත්‍රාගාරය විසින් චිත්‍රපට කර්මාන්තයට ලබාදෙන කාර්මික පහසුකම් අනුව දේශීය චිත්‍රපට 24 ක් සහ ප්‍රචාරක කෙටි චිත්‍රපට 16 කට කාර්මික සේවාවන් මෙම වසර තුලදී ලබා දී ඇත.

2. චිත්‍රපට සහ රූපවාහිනී වැඩසටහන් රූගත කිරීම සඳහා වන පහසුකම චිත්‍රාගාරයේ අභ්‍යන්තර මැදිරිය සහ චිත්‍රාගාර ආලින්දයේ මෙන්ම උද්‍යානය තුලදී ලබාදී ඇති අතර, අදාල කාලය තුල රූපවාහිනී වැඩසටහන්, වෙළඳ දැන්වීම් හා චිත්‍රපට 14 ක් සඳහා ද එම පහසුකම ලබාදී ඇත.

3. චිත්‍රාගාරයේ ශබ්ද අංශයේ එක් මැදිරියක් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව චිත්‍රපට සඳහා Surround Sound මිශ්‍රණය කිරීම සඳහා නවීකරණය කර උපකරණ සවි කිරීම.

   මෙම ව්‍යාපෘතිය සඳහා මූලික සැලසුම් අවසන් කර ඇත. ව්‍යාපෘතියේ කාර්මික උපදේශක ලෙස ඉන්දියානු ජාතික Dolby ශබ්ද උපදේශක වී. ක්‍රිෂෝර් මහතා කටයුතු කරයි. මේ සඳහා සංස්ථා සභාපති විසින් තාක්ෂණ කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටුව ක්‍රිෂෝර් මහතා සමඟ සාකච්ඡා කර අවසන් සැලසුම් (Drawings) සකස් කර ඇත. මෙම නවීකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ශබ්දාගාරයේ කුඩා මැදිරිය (විජය කුමාරතුංග මැදිරිය) තෝරාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ඉදිකිරීම් (Refurbishing) කිරීමටත්, උපකරණ මිලදී ගැනීමටත් ටෙන්ඩර් කැඳවීම 2013 වසරේ පෙබරවාරි මස සිදු කිරීමට හැකිවනු ඇත.

4. චිත්‍රපට සංස්ථාව සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් පවත්වනු ලබන සිනමා පාඨමාලාව සඳහා ප්‍රායෝගික කාර්මික පහසුකම් චිත්‍රාගාරය විසින් සපයා ඇත.

5. පැරණි සංරක්ෂණාගාරයේ තැන්පත් කර තිබූ චිත්‍රපට නෙගටිව් සහ පොසිටිව් පිටපත් ප්‍රමිතියකට අදාලව නිසි පරිදි ගබඩා කිරීම සඳහා කළු/සුදු රසායනාගාරයේ සුදුසු කාමර දෙකක් පිළිසකර කිරීම.

   මෙම ව්‍යාපෘතිය අවසන් වී ඇති අතර, චිත්‍රාගාර සංරක්ෂණාගාරය සතුව තිබූ සියළුම චිත්‍රපට එම කාමරවල නිසි පරිදි ගබඩා කර ඇත. අවශ්‍ය වායුසමීකරණ යන්ත්‍ර සහ De-Humidifiers යන්ත්‍ර සවිකර ඇති අතර, දවසේ පැය 24 තුලම ඒවා ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව ගබඩා කාමරවල උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය (Relative Humidity) පාලනය කරනු ලැබේ.

6. චිත්‍රාගාරයේ පිවිසුම් දොරටුව(Entrance Gate) (Paving Blocks) නැවත සැලසුම් කර ඉදිකිරීම, එයට යාබදව අලෙවිසැලක් ඉදිකිරීම සහ චිත්‍රාගාර පිවිසුම් මාර්ගය Paving Blocks අතුරා සකස් කිරීම.

   මෙම ව්‍යාපෘතිය ද සම්පූර්ණයෙන්ම අවසන් වී නොමැත.

7. චිත්‍රාගාරය සඳහා ආපන ශාලාවක් ඉදිකිරීම ආරම්භ කර ඇති අතර, එම ව්‍යාපෘතිය ද සම්පූර්ණයෙන්ම අවසන් වී නොමැත.

## 15.2 <u>චිත්‍රාගාර කාර්මික පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2012 වසරේ දී ක්‍රියාත්මක කල කාර්යයන්.</u>

1. චිත්‍රාගාරයේ විවිධ කාර්මික අංශ සඳහා අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීම. සංරක්ෂණාගාරය නවීකරණය යටතේ චිත්‍රපට ගබඩා කාමරයක් පිළිසකර කිරීම සහ ඒ සඳහා අවශ්‍ය වායුසමීකරණ යන්ත්‍ර De-Humidifiers මිලදී ගැනීම.

2. නව සංරක්ෂණාගාරය සඳහා වායු සමීකරණ යන්ත්‍ර 05 ක් මිලදී ගැනීම.

3. සංස්කරණ අංශයේ පරිගණක පද්ධතිය සඳහා අභ්‍යන්තර දෘඩ දැටියක් (Internal Hard Disc) මිලදී ගැනීම.

4. ශබ්දාගාරයේ ප්‍රයෝජනය සඳහා Microphone Cable ඇතුළු උපාංග මිලදී ගැනීම.

5. චිත්‍රාගාරයේ ප්‍රයෝජනය සඳහා වැකුම් ක්ලීනර් යන්ත්‍රයක් මිලදී ගැනීම.

## 15.3 චිත්‍රාගාර කාර්මික සේවාවාවන් ලබාගත් චිත්‍රපට - 2012

1. ඉගිල්ලෙන්න ඇයි දඟලන්නේ
2. රත්තරං
3. කල්පාන්තයේ සිහිනයක්
4. භගිනි
5. අභිනික්මන
6. ජීවිතේ ලස්සනයි
7. ඔබ නැතුව ඔබ එක්ක
8. වින්න වින රෝජා පූ
9. කේ සරා සරා
10. ඔළුව ජපන් කඳ ජර්මන්
11. සක්විති දඩයම
12. ඩබල් ට්‍රබල්
13. සූර්ය දරුවෝ
14. සිහිනය දිගේ එන්න
15. පිළිකඩතුරාව
16. ආත්ම වර්ෂා
17. සතියකට මට රට භාර දෙන්න
18. ප්‍රීති ඇන්ඩ් ජෝයි
19. ආදර පූජාසනේ
20. පරපුර
21. රජානෝ
22. පීටර් වන්
23. හීරෝ වන්
24. අපි මැරෙන්නෙ නෑ

## 15.4 දෘෂ්ටි පට ආරෝපණ සේවාවාවන් ලබාගත් චිත්‍රපට/ප්‍රචාරක කෙටි චිත්‍රපට - 2012

1. කර්ම
2. ශ්‍රී සිද්ධාර්ථ
3. ගීසා
4. ලයිෆ් ඉන්ෂුවරන්ස්
5. ෆැන්ටා
6. හැරිස්
7. ඩියුලක්ස්
8. සැම්සුන්
9. කැන්ඩි
10. මයික්‍රො
11. මොබිටෙල්
12. ඒ.එම්.ඩබ්ලිව්
13. අවීවා
14. ලකී යෝගට්
15. කොකා කෝලා
16. ජන ශක්ති

## 15.5 චිත්‍රාගාරයේ රූගත කළ චිත්‍රපට/රූපවාහිනී වැඩසටහන් 2012

1. පරපුර චිත්‍රපටය
2. ඉගිල්ලෙන්න ඇයි දඟලන්නේ චිත්‍රපටය
3. ඩබල් ට්‍රබල් චිත්‍රපටය
4. රාස්ස කැලේ චිත්‍රපටය
5. නිදන ගින්න චිත්‍රපටය (ඔබ නැතුව ඔබ එක්ක)
6. සඳ සිත්තම් ටෙලිනාට්‍යය
7. දෙරණ - ලිට්ල් ස්ටාර්
8. දෙරණ - ස්ටාර් චැලෙන්ජ්
9. දෙරණ - ඩ්‍රීම් ස්ටාර්
10. බස්නාහිර පළාත් සංස්කෘතික උළෙල
11. උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - ප්‍රායෝගික දේශන
12. එළිෆන්ට් හවුස්
13. මහජන බැංකුව
14. කොත්තු මී

## 16. පරීක්ෂණ කටයුතු

### 16.1 වර්ෂය තුල ඉටුකල සේවාවන්

| | |
|---|---|
| සිනමාශාලා පරීක්ෂා කල දර්ශන වාර ගණන | - 991 |
| එකතුකරන ලද හිඟ මුදල් ප්‍රමාණය | - රු. 3,988,273.87 |
| නිකුත් කල හරපත්‍ර වටිනාකම | - රු. 347,610.00 |

- ආසන ගාස්තු සංශෝධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- විදේශීය චිත්‍රපට රූගත කිරීම් අධීක්ෂණය කිරීම.

## 17. සුභසාධනය

සංස්ථා සුභසාධක සකසුරුවම් හා ණයදීම් සමිතියේ කටයුතු සමිතියේ සාමාජික සුභ සාධනය වෙනුවෙන් මෙම වර්ෂය තුලද ක්‍රියාත්මකය වූ අතර, පහත කරුණු ඒ අතර සුවිශේෂී වේ.

- සේවක ණය මුදල රු.15,000/- සිට රු. 20,000/- දක්වා වැඩි කිරීම.
- වෛද්‍ය සායනයක් පැවැත්වීම.
- සංස්ථාවට ආධාර පිණිස ලොතරැයි දිනුම් ඇදීමක් පැවැත්වීම.
- පහසු ගෙවීමේ පදනමින් කාර්ය මණ්ඩලය වෙත භාණ්ඩ ලබාදීම.

## 18. ක්‍රීඩා සංගමය

- සංස්ථා බක් මහ උළෙල 2012.04.27 වන දින සංස්ථා පරිශ්‍රයේදී පැවැත්වීම.
- ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් ආයතනය සමග පුහුණු තරඟයක් ලෙස ලෙදර් බෝල් ක්‍රිකට් තරඟයක් පැවැත්වීම.
- සංස්ථා කාර්ය මණ්ඩලයේ ඒ. ජයරත්න සිල්වා මහතා සඳහා ආසියානු බිලියඩ් තරඟාවලියට සහභාගි වීම සඳහා රු. 5,000/- ක මුදල් පරිත්‍යාගයක් සිදු කිරීම.
- ඇසිදිසි ක්‍රිකට් තරඟාවලිය සහභාගි වී ක්‍රීඩා කණ්ඩායම් 39 ක් අතරින්, 8 වන ස්ථානට පැමිණීම.
- ජනසතු සේවා ආධුනික කැරම් ශූරතා තරඟාවලියේ පිරිමි කේවල තරඟයේ ශූරතාවය සහ යුගල තරඟයේ අනුශූරතාවය පිළිවෙලින් ටී. සුරේෂ් පීරිස් සහ ඩබ්. සංජය විජේසේකර යන ක්‍රීඩකයින් විසින් දිනා ගැනීම. මේ සඳහා සංස්ථා සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සංගමයේ මෙහෙයවීමෙන් උපහාර තිළිණ ප්‍රදානෝත්සවයක් පැවැත්වීම.

## 19. ආගමික කටයුතු

### 19.1 බෞද්ධ සංගමය

- සංස්ථාවට 40 වසරක් පිරීම නිමිත්තෙන් සර්වරාත්‍රික පිරිත් දේශනාවක් පැවැත්වීම සහ සාංඝික දානයක් පිරි නැමීම.

- වෙසක් පොහොය නිමිති කොටගෙන සංස්ථා භූමියේ කෝපි දන්සලක් පැවැත්වීම හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් නෙළුම් පොකුණ අභියස පැවැත් වූ "බුද්ධාභිවන්දනා" බැති ගී වැඩසටහනට දායකත්වය සැපයීම.

- පොසොන් පොහොය නිමිත්තෙන් අනුරාධපුර රුවන්වැලි මහා සෑය අභියස කෝපි දන්සලක් පැවැත්වීම.

- වෙසක් සහ පොසොන් පොහොය උදෙසා සංස්ථා පරිශ්‍රයේ ධර්ම දේශනා පැවැත්වීම.

- සංස්ථා සේවක මහත්ම/මහත්මීන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් සඳහා අභ්‍යාස පොත් බෙදා දීම.

## 19.2 ක්‍රිස්තියානි සංගමය

- වාර්ෂික නත්තල් සුභද හමුව 34 වෙනි වරටත් සංස්ථා පරිශ්‍රයේදී උත්කර්ෂවත් අයුරින් පැවැත්වීම.

## 20. වෛද්‍ය සහනාධාර ක්‍රමය

- සාමාජික මුදල් හා සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල් මත පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සහනාධාර ක්‍රමය මෙම වර්ෂය තුල ද ක්‍රියාත්මක වූ අතර එහි පාලක කමිටුව පහත පරිදි වේ.

1. පී. ලියනගේ මහතා - කමිටු සභාපති (වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්)
2. රංජනී පෙරේරා මහත්මිය - කමිටු සාමාජික (වැ.බ. කළමනාකරු - පිරිස්)
3. රංජනී ප්‍රනාන්දු මහත්මිය - කමිටු සාමාජික (කාර්ය භාර නිලධාරී - පාලන)
4. ආර්.පී. තිස්ස මහතා - කමිටු සාමාජික (ලේකම් - ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය)
5. කේ.ආර්. වින්සන් මහතා - කමිටු සාමාජික (ජාතික සේවක සංගමයේ නියෝජිත )
6. සුබිත ඉලංගකෝන් මහතා - කමිටු සාමාජික (සභාපති - චිත්‍රපට සංස්ථා සේවක සංගමය)
7. එච්.ඩී. අසංක ගුණතිලක මහතා - කාර්යභාර නිළධාරී

## 21. වෘත්තීය සමිති

ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය , ජාතික සේවක සංගමය, විධායක නිලධාරීන්ගේ සංගමය හා චිත්‍රපට සංස්ථා සේවක සංගමය මෙම වසර තුලදී ද පාලනාධිකාරිය සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇත.

## 22. <u>ස්තුතිය</u>

2012 වසරේ සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා සංස්ථා කාර්ය මණ්ඩලය ඉතා වගකීමෙන් හා අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව සිය සේවාවන් ඉටු කර ඇත. එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉමහත් සේ අගය කරන අතර ඔවුන් වෙත සිය ස්තුතිය කෘතවේදීව පලකර සිටියි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්
අත්/කළේ

නීතිඥ අශෝක සේරසිංහ
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය

| | සටහන | 2012.12.31 දිනට | 2011.12.31 දිනට | 2011.01.01 දිනට |
|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| ඒ. යෙදවූ ප්‍රාග්ධනය | | | | |
| 1. අනුදත් ප්‍රාග්ධනය | | 10,000,000.00 | 10,000,000.00 | 10,000,000.00 |
| 2. සහභාග ප්‍රාග්ධනය | | | | |
| රජයේ ආධාර මුදල | | 10,000,000.00 | 10,000,000.00 | 10,000,000.00 |
| 3. ප්‍රදානයන් | | | | |
| භාණ්ඩාගාර ප්‍රදානයන් | | 411,400,000.00 | 404,400,000.00 | 356,400,000.00 |
| අමාත්‍යාංශ ප්‍රදානයන් | | 34,560,854.00 | 34,560,854.00 | 34,560,854.00 |
| විදේශීය ප්‍රදානයන් | | 36,442.50 | 36,442.50 | 36,442.50 |
| | | 455,997,296.50 | 448,997,296.50 | 400,997,296.50 |
| 4. සංචිත හා අතිරික්ත | 10 | 77,130,460.39 | 68,209,980.42 | 64,146,046.14 |
| | | 533,127,756.89 | 517,207,276.92 | 465,143,342.64 |
| බී. නියෝජනය වන්නේ | | | | |
| 5. ස්ථාවර වත්කම් | | | | |
| දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | | | | |
| අඩු කළා :- ක්ෂය කිරීම් | 11 | 340,797,551.12 | 343,489,275.07 | 337,814,032.19 |
| 6. දිගු කාලීන ආයෝජන | 12 | 127,000.00 | 127,000.00 | 127,000.00 |
| | | 340,924,551.12 | 343,616,275.07 | 337,941,032.19 |
| 7. ජංගම වත්කම් | | | | |
| කෙටි කාලීන ආයෝජන | 13 | 105,506,896.89 | 97,737,781.83 | 82,851,875.60 |
| තොග | 14 | 30,173,752.79 | 19,438,152.75 | 19,928,482.23 |
| ණයගැතියෝ (බොල් ණය අඩු කල පසු) | 15 | 208,865,556.18 | 189,727,926.30 | 170,653,196.80 |
| තැන්පතු හා ඉදිරි ගෙවීම් | 16 | 11,521,174.07 | 30,516,261.52 | 7,344,268.62 |
| මුදල් හා බැංකු ශේෂය | 17 | 25,587,063.28 | 15,555,331.54 | 8,862,304.37 |
| | | 381,654,443.21 | 352,975,453.94 | 289,640,127.62 |
| 8. අඩු කළා : ජංගම වගකීම් | | | | |
| බැංකු ශේෂය | 18 | - | - | 2,539,539.60 |
| තැන්පතු | 19 | 2,386,727.11 | 2,386,727.11 | 3,598,094.11 |
| පාරිතෝෂික වෙන් කිරීම් | 20 | 33,885,923.25 | 38,017,195.75 | 37,996,507.50 |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | | 103,182,563.38 | 75,376,914.91 | 70,474,094.73 |
| වෙනත් ණයහිමියෝ | 21 | 49,996,023.70 | 63,603,614.32 | 47,829,581.23 |
| | | 189,451,237.44 | 179,384,452.09 | 162,437,817.17 |
| කාරක ප්‍රාග්ධනය | | 192,203,205.77 | 173,591,001.85 | 127,202,310.45 |
| එකතුව | | 533,127,756.89 | 517,207,276.92 | 465,143,342.64 |

වැ. බ. නි. සාමාන්‍යාධිකාරී - මුදල් අධ්‍යක්ෂ සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ,
**303** , බෞද්ධාලෝක මාවත ,
කොළඹ **07.**

**2013.03.21**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

**2012.12.31 දිනට අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනය**

| | සටහන | **2011** | **2012** | ප්‍රදර්ශණ | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් |
|---|---|---|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| විකුණුම් | 01 | 47,546,217.99 | 46,369,747.24 | 38,458,570.22 | 3,851,248.58 | - | 4,059,928.44 |
| | | - | - | - | - | - | - |
| එකතු කළා : අභ්‍යන්තර මාරු කිරීම් | 02 | 1,355,497.49 | 62,264.39 | - | 2,033.31 | - | 60,231.08 |
| | | 48,901,715.48 | 46,432,011.63 | 38,458,570.22 | 3,853,281.89 | - | 4,120,159.52 |
| අඩු කළා : විකුණුම් පිරිවැය | 03 | 4,220,789.46 | 3,261,146.39 | - | 40,339.07 | - | 3,220,807.32 |
| දළ ලාභය | | 44,680,926.02 | 43,170,865.24 | 38,458,570.22 | 3,812,942.82 | - | 899,352.20 |
| අඩු කළා : වියදම් | | | | | | | |
| සේවක පාරිශ්‍රමික | 04 | 79,863,530.51 | 65,580,481.20 | 12,839,097.50 | 9,517,302.20 | 3,626,295.93 | 39,597,785.57 |
| ගමන් හා යැපීම් දීමනා | 05 | 1,134,393.76 | 710,466.30 | 7,235.00 | 31,173.00 | - | 672,058.30 |
| සැපයුම් හා උපකරණ | 06 | 8,555,869.15 | 6,991,428.07 | 8,837.60 | 1,575,977.54 | 10,167.00 | 5,396,445.93 |
| අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම් | | | | | | | |
| (ඒ) අළුත්වැඩියා කිරීම් හා නඩත්තු | 07A | 7,965,357.63 | 7,392,056.38 | 71,151.75 | 1,035,653.24 | 50,019.00 | 6,235,232.39 |
| (බී) ක්ෂයවීම් | 07B | 17,320,325.41 | 17,648,515.97 | - | 6,180,352.99 | - | 11,468,162.98 |
| ජාතික චිත්‍රපට උත්සව | 08A | 5,249,613.50 | - | - | - | - | - |
| ප්‍රචාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 08B | 17,109,652.95 | 15,048,326.66 | 702,062.58 | 1,220,521.72 | 2,088,447.65 | 11,037,294.71 |
| බොල් ණය සඳහා වෙන් කිරීම් | 15A | 833,300.00 | 20,310,000.00 | 18,138,100.00 | - | 2,047,600.00 | 124,300.00 |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 2,133,608.25 | 2,326,442.50 | 480,217.50 | 300,937.50 | 121,492.50 | 1,423,795.00 |
| චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම් | | 200,000.00 | 200,000.00 | - | - | 200,000.00 | - |
| තොග හානි | 15B | 83,755.46 | 85,120.07 | - | 5,564.47 | - | 79,555.60 |
| | | 140,449,406.62 | 136,292,837.15 | 32,246,701.93 | 19,867,482.66 | 8,144,022.08 | 76,034,630.48 |
| පොදු පරිපාලන වියදම් අන්තර්ග්‍රහණය කිරීම් | | - | - | 14,885,771.14 | 11,034,450.23 | 4,562,077.83 | (30,482,299.20) |
| | | 140,449,406.62 | 136,292,837.15 | 47,132,473.07 | 30,901,932.89 | 12,706,099.91 | 45,552,331.28 |
| මෙහෙයුම් ලාභය / අලාභය | | (95,768,480.60) | (93,121,971.91) | (8,673,902.85) | (27,088,990.07) | (12,706,099.91) | (44,652,979.08) |
| එකතු කළා : වෙනත් ආදායම් | 09 | 23,186,418.46 | 28,326,161.78 | | | | |
| වර්ෂයේ ලාභය / අලාභය | | (72,582,062.14) | (64,795,810.13) | | | | |
| අඩු කළා : භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් | | 75,000,000.00 | 68,308,000.00 | | | | |
| | | 2,417,937.86 | 3,512,189.87 | | | | |
| අඩු කළා : බදු සඳහා වෙන් කිරීම් | | - | - | | | | |
| | | 2,417,937.86 | 3,512,189.87 | | | | |
| එකතු කළා : ඉදිරියට ගෙන ආ ලාභය / අලාභය | | (57,690,716.55) | (49,864,488.59) | | | | |
83,709,000 ක් සඳහා බොල්ණය ප්‍රතිපාදනය සියයට 100 ක් ද ඉතිරි ණය ගැතියන්ගෙන් සියයට 5 ක බොල්ණය ප්‍රමාණය රු. 9,875,300 ක් වීමෙන් මුළු බොල්ණය ප්‍රතිපාදනය රු. 93,584,300 ක් විය. මේ අනුව සංස්ථාවේ ණයගැතියන් ගෙන් සියයට 31 ක් ණය ආපසු අයකර ගැනීමට නොහැකි පදනම අනුව කටයුතු කර තිබුණි.

### 2.2.5..2 ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 49,996,024 ක් වු විවිධ ණයහිමියන් තුළ වසර 5 ක් ඉක්මවු රු. 5,468,818 ක ණයහිමි ශේෂයක් වු අතර ඒවා කපාහැරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු. 151,182,047 ක් වු විත්‍රපට කුලී ණයහිමියන්ගෙන් රු. 33,443,717 ක් එනම් සියයට 22 ක් වර්ෂ 5 කට වඩා පැරණි ශේෂයන් විය.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල තිබූ පහත දැක්වෙන එක් එක් අයිතමයන් ඉදිරියෙන් දැක්වෙන සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | ගිණුමේ විස්තරය | වටිනාකම | නොසැපයූ ලිඛිත සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | හිමිකම් නොපෑ වේතන | 1,297,508 | උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (ii) | ලැබිය යුතු තැන්පතු | 906,228 | තැන්පතු කුවිතාන්සි, ශේෂ තහවුරුකිරීම් |
| (iii) | සුහසාධක සංගමයට අත්තිකාරම් | 161,440 | උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (iv) | 2012 සංයුක්ත සැලැස්මට හා ක්‍රියාකාර්සැලැස්මට අනුව සංස්ථාව විසින් කරන ලබන කාර්යයන්හි ප්‍රගතිය | ගණනය කළ නොහැක | ප්‍රගතිය පිළිබඳ තොරතුරු |
| (v) | ඉදිකිරීම් කොන්ත්‍රාත් | 43,832,996 (ගිවිසුම්ගත වටිනාකම) | විගණනයට අවශ්‍ය වූ තොරතුරු |

2.2.7 **නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 5 වන වගන්තිය | චිත්‍රපට ආනයනය කිරීම සඳහා ණය මුදල් ලබා දිය නොහැකි වුවත් දෙමළ චිත්‍රපටයක් ආනයනය කිරීම සඳහා රු. 5,000,000 ක ණය මුදලක් ලබා උ තිබුණි. තවද ගිවිසුම් ප්‍රකාරව එම මුදල් ආපසු අයකර ගෙන නොතිබූ අතර නියමිත පොලී මුදල් ද ගණනය කර නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය (ආ) හා 2000 ජූනි 12 දින හා අංක පීඑෆ් / පීඊ / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වටිනාකම රු. 35,395,774 ක් වූ ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ජේදයේ 13 වගන්තිය | |
| (i) උපවගන්ති අංක 13.2 | රාජකාරි ආවරණය සඳහා ගෙවීම් නොකළ යුතු වූවත් ඊට පටහැනිව JM කාණ්ඩයේ රාජකාරි ආවරණය වෙනුවෙන් වාර්ෂිකව රු. 9,000 ක්, MA1 කාණ්ඩයේ නිලධාරියකු හට ගෙවීම් කර තිබුණි. |
| (ii) උපවගන්ති අංක 13:3 | වැඩබැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වූවත් වැඩබැලීමේ පත්කිරීම සඳහා දීර්ඝ කාලිනව ගෙවීම් සිදුකර තිබුණි. |
| (iii) උපවගන්ති අංක 13:4 | පුරප්පාඩු වී තිබෙන තනතුරක වැඩබැලීම සඳහා එම තනතුර දැරීමට සැම අතින්ම පූර්ණ සුදුසකම් නොලත් නිලධාරියකු පත් නොකළ යුතු වූවත් ඊට පටහැනිව නියෝජ්‍ය සමාන්‍යාධිකාර (මෙහෙයුම්) හා නියෝජ්‍ය සමාන්‍යාධිකාර (මුදල්) යන තනතුරුවලට පත්කර රු. 111,089 ක් වැඩබැලීමේ දීමනා වශයෙන් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.371 | අත්තිකාරමක් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතුය. එසේ වුවත් වසර 1-12 දක්වා කාල පරාසයකට අයත් රු.3,404,707 ක අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. |
| (ඉ) | සංස්ථා චක්‍රලේඛ අංක ඔඩී/පිඊඑන්/01 හා ඔඩී/පිඊඑන්/96 | සංස්ථාවට අයවිය යුතු චිත්‍රපට කුළිය දිනපතා ගෙවිය යුතු අතර චිත්‍රපට කුළිය සඳහා සංස්ථාවට දෛනිකව බැර කළ යුතු මුදල් බැර නොකිරීම සම්බන්ධව සියයට 5 අධිභාරයක් අයකල යුතුය. මෙම චක්‍රලේඛයට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධව හරපත්‍ර නිකුත් කිරීමක් සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 64,795,810 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ වූ බදු පූර්ව ශුද්ධ අලාභය රු.72,582,062 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන ප්‍රදානයන් වශයෙන් පිළිවෙලින් රු. 68,308,000 හා රු.75,000,000 බැගින් ලැබුණු අතර එම බලපෑම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ලාභය පිළිවෙලින් රු. 3,512,190 ක් හා රු. 2,417,938 ක් විය.

### 3.2 සංස්ථාවට එරෙහිව/එදිරිව ගොනු කරන ලද නඩු

1980 පෙබරවාරි 19 දිනැති ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව, රාජ්‍ය ආයතනවල නෛතික වැඩ කටයුතු සඳහා නිතිපතිවරයාගේ සේවය ලබාගතයුතු වුවද, සංස්ථාව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර නඩු 06 ක් වෙනුවෙන් බාහිර නීතිඥයින්ට නීතිඥ ගාස්තු වශයෙන් දරන ලද වියදම රු. 507,010 ක් විය. එසේම සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 02 ක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### (අ) චිත්‍රපට ණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය මුදල් ලබා දී වසර 5 ක් ඉක්මවු නමුත් ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් නොකළ චිත්‍රපට 26 ක් සඳහා ලබා දී ඇති ණය මුදල රු.

5,418,426 ක් වු අතර 2012 දෙසැම්බර් 31 උනට රු. 4,229,646 ක් හෙවත් සියයට 78 ක් අයවිය යුතුව තිබුණි.

(ii) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබාදි වසර 5 කට වැඩි හා ප්‍රදර්ශනය සඳහා මුදාහල චිත්‍රපට 49 ක් සඳහා ලබාදි තිබු රු. 63,598,321 ක් වු ණය මුදලින් රු. 28,472,305 ක් හෙවත් සියයට 45 ක් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි.

(iii) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබාදි වසර 5 කට අඩු හා ප්‍රදර්ශනය සඳහා මුදාහල චිත්‍රපට 07 ක් සඳහා ලබාදි තිබු රු. 15,611,384 ක් වු ණය මුදලින් රු. 5,207,998 ක් හෙවත් සියයට 33 ක් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි.

(iv) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබාදි වසර 5 කට අඩු හා ප්‍රදර්ශනය සඳහා මුදා නොහල චිත්‍රපට 29 ක් සඳහා ලබා දුන් රු.28,032,604 ක් වු අතර එම මුළු ණය මුදලම 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි.

**(ආ) සිනමාශාලා සඳහා ණය ලබාදීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව 2003 වර්ෂයේදී සිනමාශාලාවක් සඳහා රු.1,100,000 ක ණය මුදලක් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානවන විටත් ගිවිසම් අත්සන් කිරීමක් සිදුකර නොතිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල රු. 709,771 ක් විය.

(ii) සිනමාශාලා දහයක් නවීකරණය සඳහා ලබාදි තිබුණු රු. 14,612,682 ක ණය මුදලින් රු.9,103,302 ක් සිනමාශාලා 07 ක් නවීකරණය සඳහා 2012 වර්ෂයට පෙර ලබාදි තිබුණ ණය ව අතර එයින් රු. 6,778,864 ක් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී සනමාශාලා 07 කින් රු. 2,349,090 ක් අයකරගෙන තිබුණ අතර සිනමා ශාලා 03 කින් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය සමඟ එලැඹි කුලී ගිවිසුම ප්‍රකාරව ජලය හා විදුලි බිල්පත්වල ගාස්තුවෙන් සියයට 50 ක් බදු ගැණුම්කරු විසින් දැරිය යුතු වුවද, සංස්ථාව විසින් බදුගැණුම්කරු විසින් දැරිය යුතු රු. 891,615 ක වියදමද දරා තිබුණි.

(ආ) නියමිත දිනට සංස්ථාවට ගෙවා නොමැති චිත්‍රපට කුලී හා සංස්ථා භාරය වෙනුවෙන් අයකරනු ලබන අධිභාරය සියයට 2.5 ක් ලාභාලාභ ගිණුමෙහි අධිභාර ආදායම් ලෙස

රු. 3,412,270 ක් දක්වා ඇතත් 2012 වර්ෂය තුල කිසිදු අධිභාර ආදායමක් ලැබී නොතිබුණි.එම ආදායම් අයකර ගැනිමට සදුසු වැඩ පිළිවෙලක් සකස්කර නොතිබුණි.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිර්ක්ෂණයන් කරනු ලැබේ.

(අ) අක්‍රමිකතා හේතුකොට ගෙන සිනමාශාලාවලින් අයකර ගතයුතු වු පෙර වර්ෂවලට අදාලව අධිභාර වෙන්ව හදුනාගත හැකි පරිදි ගිණුම්ගතකර නොතිබුණි. තවද, සංස්ථාවේ පරික්ෂණ අංශය විසින් අනාවරණය කරගත් අක්‍රමිකතා සඳහා 2012 වර්ෂය තුළදී රු. 347,610 ක් වටිනා හරපත් 100 ක් නිකුත් කරතිබුණද හරපත් 64 කින් අයවිය යුතු රු. 297,040 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දළුගම කන්ට්‍රාස් සිනමා ශාලාවේ ප්‍රතිසංස්කරණය සඳහා රු. 1,231,452 ක් සංස්ථා මුදලින් වැයකර තිබූ අතර එම මුදලින් රු. 130,501 ක් සමාලෝචිත වර්ෂයේ ලාභ අලාභ ගිණුමට හර කර තිබුණි. ඒ අනුව එම මුදල් චිත්‍රපට ශාලා සංවර්ධනය සඳහා දෙනු ලබන ණය ලෙස ගිණුම් ගත කර නොතිබුණු අතර එම ණය අය වී ඇති බවක්ද නිර්ක්ෂණය නොවුණි.

### 4.4 සෙමින් චලනය වන, නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2012 ජනවාර් 20 දින සිනමා ශාලා නවීකරණය කිරීම සඳහා ණය පහසුකම් යටතේ සිනමා ශාලා වෙත ලබාදිමට DTS ශබ්ද උපකරණ යන්ත්‍ර 5 ක් මිලදීගෙන තිබුණි. එම ශබ්ද උපකරණවලින් 02 ක් පමණක් සිනමාශාලා නවීකරණ කිරිමේ ණය පදනම යටතේ සිනමා ශාලා දෙකක් වෙත ලබා දී තිබුණි. ඉතිරි ශබ්ද උපකරණ යන්ත්‍ර 03 වර්ෂයක් ගත වී ඇතත් සිනමා ශාලා සඳහා ලබාදීමට කටයුතු නොකර නිෂ්ක්‍රියව පවතින අතර එම තොගයේ වටිනාකම රු.10,592,257 ක් විය. මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකරමින් පවතින බව සභාපතිවරයා විසින් විගණනයට දන්වා එවා තිබුණි.

### 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිර්ක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩලය තුළ විධායක ශ්‍රේණියේ තනතුරු 22 ක් හා සහායක සේවාවල තනතුරු 22 ක් පුරප්පාඩුව පැවති අතර, සුළු හා වෙනත් සේවාවල නිලධාරින්ගේ අතිරික්තය පිළිවෙලින් 06 ක් හා 09 ක් විය.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය තුළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාර් (වෘත්තිය) තනතුරක් නොතිබියදී එම තනතුරේ වැඩබැලීම සඳහා නිලධාරියකු පත්කර වැඩබැලීමේ දීමනාවක් ගෙවීම අනුමත කර තිබූ නමුත් එවැනි පත්කිරීමක් සිදු කිරීමට හා එවැනි ගෙවීමක් සිදුකිරීමට අවශ්‍ය සුදුසුකම් දැක්වීමක් අදාල අධ්‍යක්ෂ මණ්ඩල සංදේශය මගින සිදු කර

නොතිබුණි. එවැනි ඇගයීමක් සිදුකිරීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් මෙම අනුමැතිය ලබාගෙන තිබුණි.

### 4.6 වාහන පරිභෝජනය

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාව සතු වාහන ඇණිය 09 ක් වූ අතර එයින් 02 ක් වෙන්කල වාහන විය. 2012 වර්ෂය තුලදී එම වාහන ධාවනය කළ මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර 142,358 ක් වූ අතර නඩත්තු වියදම රු. 1,889,328 ක් හා ඉන්ධන වියදම රු. 2,031,455 ක් විය. ඒ අනුව කිලෝ මීටරයකට දරන ලද නඩත්තුහා ඉන්ධන වියදම පිළිවෙලින් රු.13.27 ක් හා රු. 14.27 ක් විය.

(ආ) 2008 ජුලි 28 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 50 ට අනුව වෙන්කල වාහන වෙනුවෙන් ගෙවිය යුතු උපරිම සීමාව ඉක්මවා ඉන්ධන ඇණවුම් මගින් ගෙවා තිබූ අතර වෙන්කරන ලද ඩීසල් වාහනය වෙනුවෙන් රු. 73,051 ක්ද වෙන් කරන ලද පෙට්‍රල් වාහනය වෙනුවෙන් රු. 44,291 ක්ද වශයෙන් රු.117,342 ක් වැඩිපුර ගෙවා තිබුණි.එනම් පිළිවෙලින් වැඩිපුර ඩීසල් ලීටර 664 ක් හා ප්‍රෙට්‍රල් ලීටර 301 ක් විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපති වෙත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2013 අප්‍රේල් 10 දිනදීය.

### 5.2 අභ්‍යන්තර විගණනය

-----------------------

අභ්‍යන්තර විගණක තනතුර හැර එම අංශයට අදාල අනෙකුත් නිලධාරී තනතුරු 2001 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින බැවින් ඵලදායී කළමණාකාරීත්ව පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීම සඳහා අභ්‍යන්තර විගණන අංශය ප්‍රමාණවත් දායකත්වයක් නොසපයන බව නිරීක්ෂණය විය.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

---------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් / වියදම්,තථ්‍ය ආදායම්/ වියදම් සමග සැසදීමේදී ආදායම්/ වියදම් කාණ්ඩ 16 ක් සම්බන්ධයෙන් විචලනය සියයට 50 ක ට වඩා වැඩි වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය. එක් අවස්ථාවක අයවැය විචලනය සියයට 5703 ක් විය.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සංස්ථාවේ සභාපතිවරයාට වරින්වර පෙන්වා දෙන ලදී. පහත පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ණය ශේෂ අයකරගැනිම

(ආ) ආපසු ගෙවිය යුතු තැන්පතු

(ඇ) ආයෝජන

(ඈ) සුළු මුදල් අත්තිකාරම්

(ඉ) සිනමාශාලා ණය

(ඊ) සිනමාශාලා පරීක්ෂණ

(උ) සේවක ණය

(ඌ) ගිණුම්කරණය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති.

2580247

2013.08.05

මගේ අංකය :- 104 - 24 - 005(2012)

ඔබේ අංකය :- ටීඑම්/ඊ/එන්එෆ්සී/එෆ්ජී/2012

සහකාර විගණකාධිපති ,
විගණකාධිපති දෙපාර්තමේන්තුව ,
අංක. 306/72 ,
පොල්දූව පාර ,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි ,

**<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක.38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

උක්ත කරුණ යටතේ 2013 ජුලි 03 දාතමෙන් යුතුව මා වෙත යොමු කරන ලද විගණකාධිපති වාර්තාවේ කෙටුම්පත හා බැඳේ.

2. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

2.2.1. **<u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති</u>**

**(අ)** i. සංස්ථාව ආරම්භයේ සිට මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇත්තේ මේ අයුරිනි. එනම් , සෑම වසරකම සේවයෙන් විශ්‍රාම ලබන අයෙකු හෝ සේවයෙන් ඉවත් වන අයෙකු සිටී යැයි සලකා වෙන් කරන ලද පාරිතෝෂික දීමනා ගෙවිය යුතු හෙයිනි.

ii. මෙයද සංස්ථාව ආරම්භයේ සිට අනුගමනය කරන ලද ප්‍රතිපත්තියකි. අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියෙන් ලබන වසරේ සිට ආසන්න රුපියලට දැක්වීමට කටයුතු කරනු ලැබේ.

iii. නව ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කල යුතු වුවද පහත කරුණු හේතුවෙන් ගිණුම් පිලියෙල කිරීමට නොහැකි විය.

a. සේවකයින්ට ප්‍රශස්ථ මට්ටමේ පුහුණුවක් ලබා දීමට නොහැකි වීම.
b. නව ගිණුම්කරණ ප්‍රමිත හඳුන්වා දීමට විශේෂඥ උපදෙස් සහ වරලත් ගණකාධිකාරීවරුන්ගෙන් සහාය සපයා ගැනීමට අවශ්‍ය වේ. ඒ සඳහා වියදම් දැරීමට සංස්ථාවේ මූල්‍ය තත්වය අපොහොසත් වීම.

2013 වර්ෂයේ නව ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සකස් කිරීමට කටයුතු කරන බවද දන්වා සිටිමි.

**(ආ)** මේ සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඇ)** මෙය පෙර වර්ෂ වල ලාභයෙන් කරන ලද වෙන් කිරීමක් නිසා විසර්ජනය නොකල ලාභ , අලාභ ගිණුමට ගලපන ලදී.

**(ඈ)** අවසන් ගිණුම් පිළියෙල කිරීමට තිබුණු කාලය සමග වාණිජ බැංකුවෙන් ( ලංකා බැංකුව ) ලබා ගත් පොලී අනුපාතය පදනම් කරගෙන සේවක ණය පොලිය ගණනය කරන ලදී.

**(ඉ)** ප්‍රමිත අංක. 19 අනුව 2013 වසරේ සිට ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඊ)** ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් තීරණයන්ට බලපෑම් කල හැකි පාර්ශවය වනුයේ අධ්‍යක්ෂක මණ්ඩලයයි. ඔවුන් පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. ණයගැති තොරතුරු ඔබ වෙත ලබා දී ඇත.

**2.2.2. <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

(අ) රු. 531,896.00 ක මුදල ගෙවීම් කිරීම සඳහා සකස් කර තිබු හෙයින් වැරදීමකින් උපචිත වියදම් ලේඛනයට ඇතුලත් කර තිබීම නිසා මෙම වරද සිදු වී ඇත. ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මෙයද ඉහත සඳහන් කල පරිදි වැරදීමකින් උපචිත වියදම් ලේඛනයට ඇතුලත් වීම නිසා මෙසේ සිදු වී ඇත. ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) 2013 වසරේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) ණයගැති උපලේඛනයේ ඇතුලත්ව තිබෙනුයේ පරිගණකයෙන් ඉවත් කර නොතිබු හෙයින් වන අතර , ලෙජරයේ නිවැරදිව සටහන් කර ඇත. මේ වන විට පරිගණක තොරතුරුද නිවැරදි කර ඇත.

2.2.3. **<u>නොසැසඳූ පාලන ගිණුම්</u>**

**(අ)** උපලේඛනය අනුව 2012 වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් සඳහා පොළිය රු. 4,991,555.12 කි. එසේම , 2012 වර්ෂය වෙනුවෙන් 2011 වර්ෂයේදී ලද පොලිය අදාල වර්ෂයේ ආදායමට ගෙන ඇත. ඔබ සඳහන් කර ඇත්තේ එම ප්‍රමාණය වු රු. 679,018.24 ක් වු පොලී මුදලයි.

(ආ) මෙම ගිණුම් සසඳමින් පවතී.

(ඇ) මෙම වෙනස නිවැරදි කරමින් පවතී.

(ඈ) මෙම වෙනස සෙවීම සඳහා 2001 සිට ගිණුම් සසඳමින් පවතී.

2.2.4. **<u>පැහැදිලි නොකල වෙනස්කම්</u>**

**(ආ)** උපලේඛන සහ පාලන ගිණුම් අතර වෙනස සසඳමින් පවතී.

(ඇ) උපලේඛනය අනුව ක්ෂය ගණනය නිවැරදිය. ගිණුම් වලට ගැනීමේදී එකතුව පමණක් වෙනස්වීම නිසා ඔබ සඳහන් කර ඇති පරිදි රු. 94,644.00 ක් වැඩියෙන් ගිණුම්ගත වී ඇත. 2013 දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### 2.2.5.1. ලැබිය යුතු ගිණුම්

(අ) නිෂ්පාදන ණයගැතියන්

(i) ඔබ සඳහන් කර ඇති ණයගැතියන් තුල ප්‍රදර්ශණය සඳහා මුදා හැරි චිත්‍රපට , නිෂ්පාදනය අවසන් නොකල චිත්‍රපට , චිත්‍රාගාර සේවා පමණක් ලබාගෙන නිෂ්පාදනය වෙමින් පවතින චිත්‍රපට හා සිනමාශාලා නවීකරණය සඳහා ලබා දූන් මුදල් ඇතුලත්ව තිබේ. මින් සිනමාශාලා නවීකරණය සඳහා ලබා දූන් මුදලින් රු. මි. 02 ක ප්‍රමාණයක් 2012 වර්ෂයේදී අය කරගෙන ඇත.

(ii) වත්කම් හා වගකීම් ශේෂ පත්‍රයේ වෙන් වෙන්ව සටහන් කර පෙන්විය යුතු නිසා පාලන ගිණුමේ ශේෂයට නිෂ්පාදන ණයගැති හර ශේෂය චිත්‍රපට කුලී ණයහිමි උපලේඛනයේ හර ශේෂය හා විවිධ ණයගැති උපලේඛනයේ බැර ශේෂය ගැලපීම් කර ඇත. එසේම ණයගැතියන්ගෙන් අය විය යුතු පොලිය එම ගිණුමට භාර කර 100% ක්ම නොලැබේය යන පදනම මත එයින් 75% වෙන් කිරීමේ ගිණුමට මාරු කර ඇත. ආදායමෙන් අඩු කර පෙන්වුවද ණයගැතියන් තුල එම ප්‍රමාණය ඇතුලත් වේ.

(ආ) සිනමාහල් ණයගැතියෝ

2001 සිනමාශාලා වල චිත්‍රපට බෙදා හැරීම පෞද්ගලික මණ්ඩල වලට පැවරීමට පෙර එහෙත් දැනට වසා දමා ඇති සිනමාශාලා 139 කින් අයවිය යුතු හිඟ මුදල ඔබ සඳහන් කල අගය වේ. දැනට ක්‍රියාත්මක වන සිනමාශාලා 147 කින් අයවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය රු.141,808,458.00 කි. සිනමාශාලා 21 කට සංස්ථාව ගෙවිය යුතු සේ දක්වන මුදල රු. 289,101.00 කි. තවද , 2012 වර්ෂයේදී අයවන්නට තිබු මුදල් වලින් රු. 123,075,566.00 ක මුදලක් අය කරගෙන තිබේ.

(ඇ) නිලධාරීන් දෙදෙනෙකු ඔවුන් විශ්‍රාම යන අවස්ථාවේම ණය මුදල් පියවා ඇති අතර , ඩී. එච්. කරුණාතිලක මහතාගෙන් පමණක් ණය මුදල් අය වී නොමැත. ඇපකරුවන්ද මේ වන විට සංස්ථා සේවයේ නොමැති අතර පාරිතෝෂික මුදල්ද ලබාගෙන නොමැත.

(ඈ) බොල් ණය වෙන් කිරීම.

සිනමාශාලා වලින් සංස්ථාවට ලැබිය යුතු හිඟ මුදල් කාලය හා ක්‍රියාත්මක වන ආකාරය පදනම් කර ගනිමින් නොලැබේය යන පදනම මත එම ප්‍රමාණය පමණක් බොල් ණය ලෙස වෙන් කර තිබුණද අය කර ගැනීම සඳහා තව දූරටත් කටයුතු කරනු ලැබේ.

සිනමා ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා හා චිත්‍රපට කර්මාන්තයට කරනු ලබන ආධාර වශයෙන් සංස්ථා පනත ප්‍රකාරව චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය මුදල් ලබා දේ. මෙම ණය මුදල් අය කර ගනු ලබන්නේ එම චිත්‍රපට ප්‍රදර්ශණය සඳහා මුදා හැර ලැබෙන ආදායමෙනි. යම් චිත්‍රපටයක් සඳහා ලැබෙන ප්‍රේක්ෂක ප්‍රතිචාර අඩු වුවහොත් ලැබෙන ආදායමද විශාල වශයෙන් අඩු වේ. ඒ අනුව , ලබා දී ඇති ණය මුදල් අය කර ගැනීමට අපහසු තත්ත්වයක් ඇති වේ. එසේම , චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබා දී ඇතත් , එම චිත්‍රපටය නිම නොවූ අවස්ථා තිබේ. වසර 10 කට වඩා පැරණි මෙම චිත්‍රපට වලින්ද ණය මුදල් අය කර ගත නොහැකි යැයි සැලකූ ප්‍රමාණය බොල් ණය ලෙස වෙන් කර තිබේ.

ඉහත කරුණු වලට අමතරව වෙනත් ණයගැතියන්ගේ ශේෂයෙන් 5% ක බොල් ණය ප්‍රතිපාදනයක් සලසා තිබුනේ අය කර ගත නොහැකි වුවහොත් යන අවිනිශ්චිත පදනම මත වේ. මේ අනුව බොල් ණය වල මුළු එකතුව ඔබ සඳහන් කල අගය ගෙන ඇත. එසේ වුවද , හැකි සෑම අවස්ථාවකම එම මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**2.2.5.2. <u>ගෙවිය යුතු ගිණුම්</u>**

**(අ) <u>චිත්‍රපට කුලී ණයහිමියන්</u>**

නිරීක්ෂණ නිවැරදිය.

**(ආ) <u>වෙනත් ණයහිමියෝ</u>**

නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කෙරේ.

2.2.6. **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

**(අ)** සේවක ණය , හිමිකම් නොපෑවේතන , අත්තිකාරම් ගෙවීම සම්බන්ධව මේ වන විට උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර ඇත. ලැබිය යුතු රඳවා ගැනීමේ බඳු , ලැබිය යුතු තැන්පතු , සුහසාධක අත්තිකාරම් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ පිළියෙල කර නොමැත.

**(ආ)** ටී.එම්/ඊ/එන්.එෆ්.සී/2012/වි.තො./04 මඟින් ඉල්ලා සිටි තොරතුරු සකස් කරමින් පවතී.

**(ඇ)** මෙවැනි විගණන විමසීමක් ලැබී නොමැති අතර , ටී.එම්/ඊ/එන්.එෆ්.සී./2012/වි.තො./31 මඟින් ඉල්ලන ලද තොරතුරු අදාල අංශ විසින් ඉදිරිපත් කල බව දන්වා ඇත.

**(ඈ)** සිනමාහල් ණයගැතියෝ සහ නිෂ්පාදන ණයගැතියෝ සඳහා ශේෂ සහතික කර ඔබ වෙත එවීමට ලිපි යවා ඇත. සේවක මහත්ම / මහත්මීන්ට ලබා දී ඇති ණය අත්තිකාරම්

සඳහා ශේෂ තහවුරු ලිපි යවා නොමැති අතර , ඔවුන් වෙත මාසිකව ලබා දෙන වැටුප් වාර්තාවේ හිග ණය ශේෂය පෙන්නුම් කරනු ලැබේ.

තැන්පතු සහ අත්තිකාරම් ගෙවීම සම්බන්ධයෙන් සහ සුභසාධක සංගමයට අත්තිකාරම් ගෙවීම සම්බන්ධයෙන් ශේෂ තහවුරු ලිපි යවා නොමැත.

ආපනශාලා තැන්පතු , ආරක්ෂක තැන්පතු , වෙනත් ණයහිමියෝ සඳහා ශේෂ තහවුරු ලිපි යවා නොමැති අතර , අනෙකුත් ගෙවිය යුතු ගිණුම් ශේෂයන් සඳහා ශේෂ තහවුරු ලිපි යවා ඇත.

**2.2.7. <u>නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.</u>**

**(අ)** අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක. 1107.3.1.12(5635) යටතේ මෙම ණය මුදල ලබා දී ඇත.

**(ආ)** භාණ්ඩාගාර අනුමැතිය සඳහා 2013.05.16 ලිපියක් ඉදිරිපත් කර ඇත.

**(ඇ)** මීට අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණ රජයේ විගණන අංශයට යොමු කර ඇත. අදාල අනෙකුත් ලියකියවිලි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඈ)** (i) රහස්‍ය ලේකම් තනතුරේ රාජකාරී කටයුතු කරනු ලැබූ නිලධාරිණිය සේවයෙන් ඉවත්වීම හේතුවෙන් පුරප්පාඩු වූ මෙම තනතුර සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.5 වගන්තිය අනුව එම තනතුරෙහි රාජකාරී ස්වභාවය අනුව ඒ සඳහා සුදුසුම නිලධාරිණිය වශයෙන් මෙම පත්වීම සිදු කර ඇත. මෙම නිලධාරිණියට ගෙවීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 1090.3.1.5(5461) සහ ආයතන සංග්‍රහයේ 13.7 වගන්තිය අනුව කටයුතු කර ඇත.

(ii) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ වැඩ බැලීමේ පත් කිරීම් සිදු කර ඇත. බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වී ඇත්තේ 2012 වර්ෂයේදීය. එහෙත් , ස්ථිර බඳවා ගැනීම් කල නොහැකි වී ඇති අතර , ඉන් අනතුරුව තනතුරු සඳහා බඳවා ගැනීම් පිළිබඳ පියවර ගන්නා ලද නමුත් , සුදුසු අයදුම්කරුවන් ඉදිරිපත් වී නොමැත. නැවත ඉල්ලුම්පත් කැඳවීමට පියවර ගනු ලැබේ.

(iii) ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.5 වගන්තියෙහි " බඳවා ගැනීමේ පරිපාටියෙහි නියමිත සුදුසුකම්ලත් නිලධාරියෙකු නොසිටි නම්ද , එම තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා වඩාත් සුදුසුම නිලධාරියා පත් කල හැකිය." යනුවෙන් සඳහන්ව ඇති ප්‍රතිපාදනය අනුව MM-1 තනතුරෙහි රාජකාරී කටයුතු කල ඒ සඳහා සුදුසුම නිලධාරිණිය අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියෙන් ( අ. ම. තීරණ අංක. 1104.3.1.3(5594) ) පත් කර ඇත.

එසේම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් තනතුරෙහි රාජකාරී ඉටු කල නිලධාරී මහතා 2012.07.18 වන දින වැඩ තහනමට ලක්ව එම තනතුර පුරප්පාඩු වීම හේතුවෙන් රාජකාරී ඉටු කර ගැනීමේ අවශ්‍යතාවය මත ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.5 වගන්තිය අනුව ඒ වන විට MM-1 තනතුරෙහි රාජකාරී කටයුතු කල නිලධාරී මහතා ඒ සඳහා සුදුසුම නිලධාරියා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පත් කර ඇත.( අ. ම. තීරණ අංක. 1105.3.1.5(5607) )

**(ඉ)** (i) මූල්‍ය පාලනය සම්බන්ධව කටයුතු කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල තීරණ ක්‍රියාත්මක වේ. ඒ අනුව , මිල කමිටු තීරණය රු. 350,000/- දක්වාද , සංස්ථා ටෙන්ඩර් මණ්ඩලය රු.ල. 500 දක්වාද , රු.ල.500 ට වැඩි ටෙන්ඩර් සඳහා අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයද වගකිව යුතුව ඇත. මීට අමතරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත හදිසි මිලදී ගැනීම් සඳහා සභාපතිතුමාට රු. 200,000/- ද , සාමාන්‍යාධිකාරී රු. 100,000/- ද , නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් රු. 50,000/- ද අනුමත කල හැකි අතර , සියලුම අංශ ප්‍රධානීන්ගේ ඉල්ලීම මත රු. 1,000/- කට අඩු සුළු මුදල් ලබා දිය හැක. මේ අනුව , අංශ ප්‍රධානීන්ගේ අනුමැතියෙන් ගෙවීම සඳහා ඉල්ලුම් පත්‍රයකින් , මිලදී ගැනීමේ ඇණවුම් මඟින්ද , ගෙවීම් කරනු ලබන අතර අදාල වවුචර්පත් සකස් කිරීම සඳහා නිලධාරියෙකු යොදවා ඇත. එම ගෙවීම් වවුචර , ගෙවීම් අංශයේ තවත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කොට කළමනාකරුවන් දෙදෙනෙකු විසින් සහතික කර , අනුමත කිරීම කරනු ලබන අතර , ඒ සඳහා චෙක්පත් ලිවීමට නිලධාරියෙකු පත් කර ඇත. එම
චෙක්පත් සඳහා වවුචරය සහතික කර , අනුමත කරන නිලධාරීන්ට අමතරව වෙනත් මුදල් කළමනාකරුවෙකු විසින් චෙක්පතට පළමු අත්සන යොදනු ලැබේ. මූල්‍ය බලතල පැවරීම පිළිබඳ ලිපි ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ.

(ii) චිත්‍රපට කලාකරුවන් සහ කාර්මිකයින් 41 දෙනෙකු සඳහා ඔවුන්ගේ බැංකු ගිණුම් වලට තැපැල් කරනු ලැබේ. මේ සඳහා ලදුපත් ලැබෙනු ඇත. සංස්ථා මුදල් අයකැමි ඒකකය වෙත 11 දෙනෙකු පැමිණ මුදල් ලබා ගන්නා අතර , ඔවුන්ගේ අනන්‍යතාවය පරීක්ෂා කොට මුදල් ගෙවනු ඇත.

(iii) මුදල් අයකැමි ඒකකයේ සේවය කරනු ලබන අයකැමිවරුන්ගෙන් වර්තමානයේ රු. 5,000/- ක ඇපයක් තබා ගනු ඇත. ඒ අනුව , මුදල් අයකැමි පත්වීම් ලබා දී ඇති නිලධාරී මහතාගෙන් තැන්පතු ලබා ගෙන ඇත. අනෙක් නිලධාරී මහතා මුදල් අයකැමිවරයෙකු නොවන අතර , තව කෙනෙකු බඳවා ගන්නාතුරු තාවකාලිකව යොදවා ඇත. එවැන්නෙකුගෙන් ඇප ලබා ගත නොහැක.

(iv) මුදල් අයකැමි ඒකකයේ සේප්පු දෙක සඳහා වෙනම යතුරු යොදා ඇත. එම යතුරු 02 මුදල් අයකැමිවරුන් භාරයේ තබා ඇත. නොදන්වා යම්කිසි මුදල් අයකැමිවරයෙකු නොපැමිණි විටක පැමිණි මුදල් අයකැමිට නොපැමිණි මුදල් අයකැමිගේ සේප්පුව භාවිතා කල හැකිය.

(v) මේ සඳහා කටයුතු කරගෙන යමින් පවතී.

(vi) මෙයින් පෙන්වා ඇති කරුණු නිසි පරිදි ඉටු කර ඇත. නිලධාරින් අස් වී යාම මත නව තනතුරු වලට බඳවා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඇති වූ අධික රාජකාරී මත අතපසුවීම් සිදු වී තිබිය හැකි අතර , ඉදිරියේදී එයද අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඊ) (i) නව සංවිධාන සැලැස්ම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යැවීමේ අවශ්‍යතාවයක් නොමැත. අදාල දෙපාර්තමේන්තුව එකඟතාවය ලබා දී ඇත.

(ii) මානව සම්පත් සම්බන්ධයෙන් නීති , රෙගුලාසි ඇතුලත් “ විනය රීති අත්පොත ” සකස් කර මුද්‍රණය සඳහා යොමු කර ඇත.

(උ) ලේඛනයක් ආරම්භ කර පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ.

(ඌ) සංස්ථාවට දෛනිකව බැර කල යුතු මුදල් බැර නොකිරීම සම්බන්ධව 2.5% අධිභාරයක් අය කරනු ලබන අතර , ඒ පිළිබඳව මාසිකව සිනමාශාලා වෙත යවනු ලබන වාර්තාවේ සඳහන් කරනු ලබයි.

(ඍ) රහස්‍ය ලේකම් තනතුරේ රාජකාරී ඉටු කරනු ලැබූ නිලධාරිණිය සේවයෙන් ඉවත්වීම හේතුවෙන් පුරප්පාඩු වූ මෙම තනතුරෙහි රාජකාරී ඉටු කිරීමේ අවශ්‍යතාවය මත 2001 වර්ෂයේ සිට ඉංග්‍රීසි යතුරු ලේඛිකා ස්ථිර තනතුරේ සේවය කල මෙම නිලධාරිණිය අදාල තනතුරේ රාජකාරී කටයුතු ආවරණය කිරීම සඳහා පත් කර ඇත.

නව අනුමත කාර්ය මණ්ඩලයේ ලඝු ලේඛිකා තනතුර MA-1 සේවා කාණ්ඩය යටතට ගෙන ඇත. 2012 සැප්තැම්බර් 14 දිනැති අංක.DMS/E3/53/4/308/2 දරන අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව MA-1 තනතුර දැරීම සඳහා වන සුදුසුකම් අදාල නිලධාරිණිය විසින් සපුරාගෙන ඇත.

3. <u>මූල්‍ය සමාලෝචනය</u>

**3.1** <u>**මූල්‍ය ප්‍රතිඵල**</u>

නිරීක්ෂණ නිවැරදිය.

**3.2 සංස්ථාවට එරෙහිව / එදිරිව ගොනු කරන ලද නඩු**

සංස්ථාවට දීර්ඝ කාලයක සිට සමහර අවස්ථාවන්හිදී පමණක් හැරුණු විට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහිතව පෞද්ගලික නීතිඥ සහාය ලබාගෙන ඇත. නීතිපති දෙපාර්තමේන්තුව වෙත නඩු යොමු කල අවස්ථාවන්හිදි එකී දෙපාර්තමේන්තුවේ සේවය විශේෂයෙන්ම හදිසි අවස්ථාවන් වලදී ලබා ගත නොහැකි වී ඇත. කෙසේ වෙතත් නීතිපති දෙපාර්තමේන්තුවද අධික ගාස්තු අය කිරීමේ හේතුව මත සංස්ථා පමණක් නොව අනෙකුත් රාජ්‍ය ව්‍යාපාර ආයතනයන්ද ස්වකීය නඩු සඳහා පෞද්ගලික නීතිඥයන් පත් කර ගැනීම සාමාන්‍ය ක්‍රියා පටිපාටියයි.

අධිකරණයක නඩු පවරන අවස්ථාවකදී එකී නඩු තීන්දුවෙන් ඉල්ලා සිටින වන්දි මුදල හෝ ගෙවීම අසම්භාව්‍ය වගකීමක් ලෙස සටහන් කල නොහැක. එය නඩුවේ කාර්යභාරය සඳහා ඉදිරිපත් කරන වටිනාකමක් නිසා තත්‍ය වටිනාකමක් නොවන නිසාය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**(අ) චිත්‍රපට ණය**

(i) නිරීක්ෂණ නිවැරදිය. ලබා දුන් ණය මුදලෙන් අය වී තිබෙනුයේ චිත්‍රාගාර සේවාවන් සඳහා ලබා දුන් ණය මුදල් වේ. එමෙන්ම . මෙම චිත්‍රපට නිෂ්පාදනය නිම නොවී ඇති අතර , ඒ පිලිබඳව සොයා බැලීමට 2013 ණය කමිටුව වෙත යොමු කර ඇත.

(ii) නිරීක්ෂණ නිවැරදිය. ණය අය කර ගැනීම සඳහා කටයුතු කිරීමට ණය කමිටුව වෙත යොමු කර ඇත.

(iii) නිරීක්ෂණ නිවැරදිය. ණය අය කර ගැනීම සඳහා කටයුතු කිරීමට ණය කමිටුව වෙත යොමු කර ඇත.

(iv) නිරීක්ෂණ නිවැරදිය. ණය අය කර ගැනීමටත් , චිත්‍රපට නිෂ්පාදන කටයුතු පිළිබඳව සොයා බැලීමටත් ණය කමිටුව වෙත යොමු කර ඇත.

**(ආ) සිනමාශාලා සඳහා ණය ලබා දීම.**

(i) ණය මුදල් වාරික වශයෙන් ගෙවා ගෙන යනු ලබන අතර , ගිවිසුම් අත්සන් කර නොමැත.

(ii) 2012 වසරේදී කිසිදු මුදලක් අය කර ගත නොහැකි වූ සිනමා ශාලා 03 අතුරින් දර්ශණ සිනමාශාලා - අකුරැස්ස පමණක් 2013 වසරේදී සියලුම ණය මුදල් ගෙවා නිදහස්ව ඇත.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**(අ)** සංස්ථාව විසින් වියදම දරා තිබුණද එය සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයෙන් අය කර ගැනීමට අදාල අංශ වෙත දැනුම් දී තිබේ. එකී මුදල් ප්‍රතිපූර්ණය කර ගනු ලැබේ.

(ආ) අවිනිශ්චිතව පවතින මෙම ණය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ණය කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.

(ඇ) ගැසට් නිවේදනය පරිදි නියමිත දිනට ගෙවා නොමැති චිත්‍රපට කුලිය හා සංස්ථා වැඩිවීමේ මුදල වෙනුවෙන් 2.5% ක අධිභාරයක් පනවනු ලැබුවද සිනමාහල් වලට ලැබෙන අදායම අඩුවීම , නඩත්තු වියදම ඉහල යාම හා ප්‍රේක්ෂකයන්ගේ පැමිණීම අඩුවීම හේතුවෙන් සිනමාහලෙන් ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇත.

තවද , සිනමාශාලා විසින් මුදල් ගෙවීමේදී චිත්‍රපට කුලිය , භාරය , අධිභාරය වශයෙන් වෙන් වෙන්ව මුදල් ගෙවනු නොලබයි. එමෙන්ම , මෙම මුදල් අය කර ගැනීම සඳහා මුදල් අංශය , රිත්මා හා පරීක්ෂණ අංශය කටයුතු කරයි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) මේ සම්බන්ධයෙන් පරීක්ෂණ අංශය දැනුවත් කර ඇති අතර , මුදල් අය කර ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ.

(ආ) ගණිතමය වශයෙන් ඔබ සඳහන් කල අගයන් නිවැරදි වුවද 2012 මිලදී ගැනුම් ලෙස වැඩි වශයෙන් සිදු කර තිබෙනුයේ සේවාවන් ලබා ගැනීමය. එමෙන්ම , ඉදිරි වර්ෂය සඳහා මිලදී ගැනීම්ද ඇතුලත්ය.

(ඇ) සංස්ථාව විසින් පරිපාලනමය කටයුතු සිදු කල අවධියේ මෙම සිනමාශාලාව ප්‍රතිසංස්කරණය කර ඇත. ඒ අනුව , සිනමාශාලාවේ ලාභ පාඩු සංස්ථාවට දරා ගැනීමට සිදුව ඇත. එබැවින් මෙම වියදම ලාභයෙන් කපා හැර ඇත.

## 4.4 සෙමින් චලනය වන නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(අ) (i) නිරීක්ෂණ සාවද්‍යය. DTS පද්ධති මිලදී ගැනීම සඳහා කිසිදු අනුමැතියක් ලැබී නැත. අත්තනෝමතිකව නිලධාරීන් DTS පද්ධති මිලදී ගෙන ඇත. මෙම DTS ශබ්ද පද්ධති මිලදී ගැනීම සම්බන්ධයෙන් මේ වන විට අභ්‍යන්තර පරීක්ෂණයක් සහ අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවෙන් විමර්ශනයක් සිදු කරමින් පවතී.

එසේම , ඉතිරි වු මෙම ශබ්ද පද්ධති ණය පදනම මත ඉල්ලුම් කර ඇති සිනමාශාලා වෙත ලබා දීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. එහෙත් , මෙම පද්ධති වල වියදම වෙළඳපොල මිලට බොහෝ සෙයින් අධි ප්‍රමාණය.

(ආ) මෙම වත්කම් කෞතුක සම්පත් ලෙස සංරක්ෂණය කිරීමට කටයුතු කරමින් පවතී.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) නිරීක්ෂණ නිවැරදිය.

**(ආ)** නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වෘත්තීය යනු වත්මන් අනුමත කාර්ය මණ්ඩලයේ සඳහන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් තනතුර හැඳින් වු පෙර නාමය වේ. එසේම , HM කාණ්ඩයේ තනතුරු වල රාජකාරී ඉටු කිරීම සඳහා නිලධාරීන් නොමැති වීම හේතුවෙන් කළමනාකාරීත්වය අඩපණ වී තිබු අවස්ථාවක රාජකාරී ඉටු කිරීමේ අත්‍යාවශ්‍යතාවය හේතුවෙන් ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.5 වගන්තිය අනුව ඒ සඳහා වඩාත්ම සුදුසු පුද්ගලයා ලෙස MM-1 තනතුරෙහි රාජකාරී කටයුතු කල එම නිලධාරිණිය අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියෙන් එම තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇත. එමෙන්ම , ඒ වන විට එම නිලධාරිණිය අදාල ක්ෂේත්‍රයේ වර්ෂයකට අධික කාලයක් අධීක්ෂණ නිලධාරීයා වශයෙන් රාජකාරී කටයුතු සිදු කර ඇත.

සංස්ථා සේවකයින්ගේ ඉල්ලීම මත විභාග , සම්මුඛ පරීක්ෂණ , විදේශ ගතවීම් යන අවස්ථා වලදී සහ පාසල් , බැංකු සහ වෙනත් මුල්‍ය ආයතන වෙත ඉදිරිපත් කිරීම සඳහා සේවා සහතික නිකුත් කර ඇත. සංස්ථාව විසින් පුර්ව අවස්ථාවන් වලදි කටයුතු කර ඇති අයුරින් එම නිලධාරිනියගේ ඉල්ලිම මත ඇය විසින් සත්‍ය වශයෙන් වැඩ බැලු තනතුරට අදාලව මෙම සේවා සහතිකය නිකුත් කර ඇත.

**(ඇ)** අනුමත කාර්ය මණ්ඩලයේ පවතින MM-1-1 වැටුප් කාණ්ඩයේ පුරප්පාඩු වී තිබු තනතුරු 08 සඳහා බඳවා ගැනීමේ පරිපාටි අනුමත නොවී තිබීම හේතුවෙන් මෙම පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. එම නිසා අංශ වල රාජකාරී කාර්යක්ෂම හා අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත කිසිදු දීමනාවක් ගෙවීමකින් තොරව MA වැටුප් කාණ්ඩයේ නිලධාරීන් අංශ ප්‍රධානීන් වශයෙන් රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කර ඇත.

නව බඳවා ගැනීමේ පරිපාටි අනුමත වීමෙන් පසු එම තනතුරු 08 හි පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශයේ උපදෙස් පරිදි අයදුම්පත් කැඳවන ලදී. ඉන් තනතුරු 03 ක් සඳහා පමණක් බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් තිදෙනෙක් 2013.04.17 දින සිට බඳවාගෙන ඇත. සහකාර සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු හා කාර්මික සේවා තනතුර සඳහාද අයදුම්පත් කැඳවුවද , සුදුසුකම් ලත් අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම මත එම පුරප්පාඩුව පිරවීමට නොහැකි වී ඇත.

(ඈ) HM-2-1 කාණ්ඩයේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා වු පුරප්පාඩුව පිරවීම සඳහා අමාත්‍යාංශයේ උපදෙස් පරිදි අයදුම්පත් කැඳවුවද ප්‍රමාණවත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඒ සඳහා ඉදිරිපත් නොවීම මත එම තනතුර පිරවීමට නොහැකි වී ඇත. එම තනතුරේ වැඩ බැලීම සඳහා අමාත්‍යාශයේ නිලධාරියෙකු 2013.01.31 දින සිට පත් කර ඇත.

අනුමත කාර්ය මණ්ඩලයේ HM තනතුරක පුරප්පාඩුවක් පවතින අවස්ථාවකදී කාර්ය මණ්ඩල ලේඛනයේ ඊළඟ කලයේ සිටින MM තනතුරේ නිලධාරීන් වැඩ බැලීම සඳහා පත් කිරීමට කටයුතු නොකර ඒ සඳහා වෙනත් නිලධාරීන් පත් කිරීමේ හැකියාවක් නොමැත.

ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.5 වගන්තියෙහි සඳහන්ව ඇති ප්‍රතිපාදනය අනුව MM-1 තනතුරෙහි රාජකාරී කටයුතු ඉටු කරන ඒ සඳහා සුදුසුම නිලධාරීන් රාජකාරී අවශ්‍යතාවය මත HM-1-1 වැටුප් කාණ්ඩයේ තනතුරු දෙකෙහි වැඩ බැලීම සඳහා පත් කර ඇත.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් තනතුරේ පුරප්පාඩුව පිරවීම සඳහාද ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට පාලනාධිකාරිය විසින් කටයුතු කලද , ඒ සඳහා වන සුදුසුකම් සපුරන ලද අයදුම්පත් ඉදිරිපත් නොවීම මත එකී තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට නොහැකි වී ඇත.

2012.12.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් තනතුරේ වැඩ බැලීම සඳහා අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත් කර ඇත.

**4.6 <u>වාහන පරිභෝජනය</u>**

(i) නිරීක්ෂණ නිවැරදිය.

(ii) නිරීක්ෂණ නිවැරදි විය යුතුය. වාහන භාවිතයට අදාල වන්නේ 2011.02.09 දින 13/2008/IV චක්‍ර ලේඛනයයි. ඩීසල් වාහනයට ලීටර් 170 ක් අදාලය. ඒ සඳහා භාවිතා වන ඩීසල් ප්‍රමාණය

ලීටර් 2464 ක් වන අතර , නියමිත ප්‍රමාණය ලීටර් 2040 වන හෙයින් අතිරේක ලීටර් 424 පමණක් වැය වී ඇත. එකී ප්‍රමාණය සභාපතිවරයා වශයෙන් විශේෂ හා අතිරේක රාජකාරී සඳහා ගමන් බිමන් වලට යෙදී ඇත. පෙට්‍රල් වාහන සඳහා ක්‍රියාකාරී අධ්‍යක්ෂකට හිමි ලීටර් ප්‍රමාණය 1680 (140 x 12 ) කි. එකී වාහනයද අතිරේක රාජකාරී සඳහා යෙදී ඇත.

**5. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>**

**5.1 <u>මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>**

මුල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කර විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම නිසා ප්‍රමාද දෝෂයක් ඇති විය.

**5.2 <u>අභ්‍යන්තර විගණනය</u>**

අභ්‍යන්තර විගණක තනතුර 2001 වසරේ පිරවීම හේතුවෙන් අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරේ අවශ්‍යතාවයක් නොතිබුණි. 2006 වසරේ සිට නව අනුමත කාර්ය මණ්ඩලයට අනුව අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරක් අනුමත කර නොමැත. අන්තර්ග්‍රහණ කටයුතු පිරවීමෙන් පසුව අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමේදී අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

**5.3 <u>අයවැය ලේඛනමය පාලනය</u>**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් / වියදම් , තත්‍ය ආදායම් / වියදම් සමඟ සැසඳීමේදී විචලනය 50% කට වඩා වැඩි වීමට හේතු වුයේ පාලනාධිකාරියේ ඇති වු වෙනස්වීම් හා පැවති අර්බුධකාරී තත්ත්වය උඩ ඇස්තමේන්තුගත කරන ලද වැඩ කටයුතු අඩපණවීම හේතුවෙනි. ඔබ දක්වා ඇති 57.03% ක විචලනය වනුයේ බොල් ණය සඳහා වෙන් කරන ලද ප්‍රමාණයයි. එනම් වසා ඇති සිනමාශාලා වල හිඟ ශේෂයන් සහ 2001 පෙර පැවති සිනමාශාලා වල හිඟ ශේෂයන් සඳහා බොල් ණය වෙන් කිරීමක් කර ඇති හෙයිනි.

**6. <u>පද්ධති හා පාලනයන්</u>**

2013 වසරේදී ඔබ පෙන්වා ඇති කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත.

මෙයට ,
විශ්වාසී වූ ,

නීතිඥ අශෝක සේරසිංහ
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

පිටපත් :- ලේකම් - ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය
ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
இலங்கைத் தேசியத் திரைப்படக் கூட்டுத்தாபனம்
National Film Corporation of Sri Lanka

www.nfc.gov.lk

Printed By United Merchants Printers (Pvt) Ltd. Colombo 12.